ශ්‍රී ලංකා මහ බැංකුව

සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

31 වෙළුම 7-8 කලාපය 2012 ජූලි - අගෝස්තු

ටියුලිප් 1637

දකුණු මුහුදු 1720

දුම්රිය මාර්ග 1893

ඩොට් කොම් 2000

නිවාස 2007

වෝල් ස්ට්‍රීට් 2008

# ඉතිහාසයෙන් පාඩම්...

ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# ඉතිහාසයෙන් පාඩම්...

අප අපගේ එදිනෙදා කටයුතු සපුරා ගැනීම සඳහා මුදල් ඉපයිය යුතුය. අත්‍යාවශ්‍යයෙන් ම අනාගතය වෙනුවෙන් මුදල් ඉතිරි කළ යුතුය. ආයෝජනය කළ යුතුය. එහෙත් ඒ සියලු දෙයම කළ යුත්තේ පමණ දැනය. දුරදිග සිතා බලාය. සිහිබුද්ධිය ඇතිවය. අධික තෘෂ්ණාව හා ගිජුකම ඉහවහා ගිය කල ඉදිරියේ ඇති අවදානම, ව්‍යසනය නොපෙනී යයි. එවිට කටයුතු කරන්නේ අවට ඇති කිසිවක් නොපෙනෙන ලෙසයි. අවිචාරවත් ලෙසයි. එවිට එල්බගත් අරමුණ ම නිවැරදි ලෙස දකියි. අනතුරු කිසිවක් නොදකී. අතුරු පල කිසිවක් නොදකී. බොහෝ විට මෙවැනි අරමුණු ඔස්සේ ඉබාගාතේ දිව යෑම් කෙළවර වන්නේ පතුලක් නොපෙනෙන අගාධයකට ඇද වැටීමෙනි. එවැනි සිදුවීම්වල එදා අද යැයි වෙනසක් නැත.

17 වන ශත වර්ෂයේ ඕලන්දයේ ඇතිවූ ටියුලිප් බුබ්බුලයේ පටන් දකුණු මුහුදු බුබ්බුලය, දුම්රිය මාර්ග බුබ්බුලය ආදී අර්බුද රැසක් ඔස්සේ පැමිණි මූල්‍ය හා ආර්ථික අර්බුද විසින් ද 2007 වසරෙහි ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ආරම්භ ව යුරෝපය පුරා පැතුරුණු මූල්‍ය සහ ආර්ථික අර්බුදය විසින් ද අපට පසක් කර දෙන්නේ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව සඳහා විචක්ෂණශීලි බව කෙතෙක් දුරට ඉවහල් වෙනවා ද යන්නයි.

වර්තමාන ලෝක ආර්ථික රටාව තුළ එක් එක් රටට හුදෙකලාව කටයුතු කිරීමට හැකියාවක් නැත. එකිනෙක රටවල් නොයෙකුත් ආකාරයෙන් අනෙකුත් රටවල් හා බැඳී සිටී. ඒ නිසාම එක් රටක මූල්‍ය හෝ ආර්ථික හෝ අර්බුදයක් ඇතිවන විට අනිවාර්යයෙන් ම එහි පල විපාක එම රට හා නන් විධ අයුරින් කටයුතු කරන, ගනුදෙනු කරන අනෙක් රටවලට ද බලපායි. විශේෂයෙන් ම බලවත් රටවල් ආර්ථික අර්බුදවලට මුහුණ දෙද්දී ඒවායේ අහිතකර බලපෑම් නොයෙකුත් මුහුණුවරින් ඊට වඩා දුර්වල ආර්ථිකවලට විතැන් කෙරෙයි. ගෙවුම් ශේෂ හිඟය පුළුල්වෙයි. ආර්ථික වර්ධනය පහළ වැටෙයි. අයවැය හිඟය පුළුල්වෙයි. මුදලේ අගය පිරිහෙයි. සෘජු විදේශ ආයෝජන ගලා ඒම අඩුවෙයි. විදේශ සංක්‍රාම නොලැබී යයි. විදේශ වෙළෙඳාම පහත වැටෙයි. සංචාරක කර්මාන්තය බිඳවැටෙයි. දේශීය කර්මාන්ත බිඳ වැටෙයි. සේවා වියුක්තිය ඉහළ යයි. මේ නිසා බොහෝ විට මූල්‍ය අර්බුදයක් ආර්ථික අර්බුදයක් බවට ද පෙරළෙයි.

මූල්‍ය අර්බුද මඟින් හෙළි කෙරෙන අවිචාරශීලි බව විසින් ම මූල්‍ය සාක්ෂරතාවෙහි ඇති වැදගත්කම ද පෙන්වාදෙයි. ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව සිය මූලික අරමුණක් ලෙස සලකයි. මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව තහවුරු කිරීමට නොයෙකුත් විධික්‍රම අනුගමනය කරයි. ප්‍රකාශන, පුවත්පත් නිවේදන, දැන්වීම් හා වාර්තා වැඩසටහන් ආදී නොයෙකුත් ආකාරයෙන් මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට කටයුතු කරයි.

"සටහන" මඟින් ද නොයෙකුත් අවස්ථාවල නීති විරෝධී පිරමීඩ යෝජනාක්‍රම වැනි අවිචාරශීලි ආයෝජන ක්‍රමවල ඇති අනතුරුදායක බව පිළිබඳවත් වත්මන් සහ වසර සිය ගණන් පැරණි මූල්‍ය සහ ආර්ථික අර්බුද පිළිබඳවත් වරින් වර තොරතුරු රැසක් ඉදිරිපත් කර ඇත. මෙවර "සටහන" කලාපයෙන් ද එවන් අවස්ථාවක් පිළිබඳ තොරතුරු ගෙන එයි. ඒ ලොව වාණිජ ක්ෂේත්‍රය පුළුල් කිරීමටත් ගනුදෙනු ක්‍රමවල නොයෙකුත් වැඩි දියුණු කිරීම්වලටත් මුල්වූ ලන්දේසීන් විසින් අවිචාරශීලි ලෙස ටියුලිප් සඳහා මුදල් ආයෝජනය කිරීමෙන් ඕලන්ද ආර්ථිකයත් එහි වාණිජ අංශයත් කම්පනයට ලක් කළ කතා පුවතයි. ඒ ලොව වාර්තාගත පළමු මූල්‍ය අර්බුදය ලෙස සැලකෙන "ටියුලිප් උන්මාදය" පිළිබඳවයි.✪


සටහන ISSN 1391-3697

2012 ජුලි/ අගෝස්තු

පිටපතක මිල : රු. 10.00
වාර්ෂික දායකත්වය : රු. 240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ



| ලිපි යොමුව | පිටුව |
|---|---|
| ටියුලිප් උන්මාදය | 3 |
| තොරතුරු ආර්ථික විද්‍යාව | 8 |
| රාජ්‍ය ණය ප්‍රවණතා | 13 |



"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.



# ටියුලිප් උන්මාදය

**විනීතා හේරත්**
සන්නිවේදන දෙපාර්තමේන්තුව

ලොව නන් දෙසින් වරින් වර නොයෙකුත් ආකාරයේ ආර්ථික හා මූල්‍ය අර්බුද පිළිබඳව අපට අසන්නට, දකින්නට ලැබෙයි. ආර්ථික බිඳවැටීම්, ජනතාව පීඩාවට පත්වීම් සහ ඒ හා සම්බන්ධ ජනතා උද්ඝෝෂණ පිළිබඳ වාර්තාවෙයි. මෙවැනි අර්බුද වර්තමානයට පමණක් සීමාවූ ඒවා නොවෙයි. එහෙත් මෙම පුවත් අතර ඉතා දීර්ඝ ඉතිහාසයකට නෑකම් කියන්නේ "ටියුලිප් උන්මාදයයි". අද ලෝක මූල්‍ය අර්බුද පිළිබඳව කතා කරන්නෝ ඉතිහාසයේ වාර්තාගත පළමු මූල්‍ය අර්බුදය ලෙස කතා කරන්නේ 17 වන ශත වර්ෂයේ ඕලන්දයේ ඇතිවූ මෙම ටියුලිප් උන්මාදය පිළිබඳවයි. සියුමැලි මලකට ශක්තිමත් ආර්ථිකයක් බිඳදැමිය හැකිවේ යැයි සිතීම පවා විස්මයට කරුණෙකි. එහෙත් එය අතිශයෝක්තියක් නොවේ. ටියුලිප් මලෙහි සුන්දරත්වයට වසඟව, එය උමතුවක් බවට පෙරළුණු ලන්දේසීහු ටියුලිප් මිලට ඉතා වේගයෙන් ඉහළ යෑමට මං සැලසූහ. එහෙත් වේගයෙන් ඉහළ ගිය මිල ගණන් ඊටත් වඩා වේගයෙන් පහළට කඩා වැටීමෙන් ඕලන්දයේ වාණිජ අංශය පෙර නොවූවිරූ දෙදරීමකට ලක්විය. කම්පනයකට ලක්විය. එය යථා තත්ත්වයට පත්වීමට වසර ගණනාවක්ම ගතවිය. ටියුලිප් ප්‍රේමය, ටියුලිප් ලෝලය, ටියුලිප් උන්මාදය, ටියුලිප් බුබ්බුලය ලෙස ඉතිහාසගතව ඇත්තේ මෙම සිදුවීමයි.

### ටියුලිප් මලෙහි යුරෝපා ආගමනය

එය ආරම්භවූයේ ඉතාමත් ම අහිංසක ආකාරයෙනි.



කැරොලස් ක්ලූසියස්

බටහිර යුරෝපයේ ප්‍රථම වතාවට ටියුලිප් වගාකරන ලද්දේ 16 වන ශත වර්ෂයේ මැද භාගයේය. එහෙත් ඒවන විටත් කොන්ස්තන්තිනෝපලයේ (වර්තමාන තුර්කියේ) ටියුලිප් වගාව ජනප්‍රියව තිබිණි. ඕලන්දය නෙදර්ලන්තයේ බටහිර පිහිටියේ ය. එවකට (1581 - 1795) නෙදර්ලන්තය හඳුන්වන ලද්දේ එක්සත් ප්‍රදේශය (United Province) ලෙසයි. ලන්දේසි ජාතික උද්භිද විද්‍යාඥයෙකුවූ කැරොලස් ක්ලූසියස් (Carolus Clusius) විසින් මෙම ප්‍රදේශයට ටියුලිප් රැගෙන ආවා යැයි සැලකේ. ඒ 1593 දීය. ඔහු ලේඩන් විශ්ව විද්‍යාලයේ (University of Leiden) ටියුලිප් පිළිබඳව පර්යේෂණවල නියැලුනේය. එහෙත් ඊට පසු වසර 10 තුළ යුරෝපයෙහි ටියුලිප් ජනප්‍රිය කළේ කොන්රැඩ් ජෙස්නර් (Conrad Gesner) නමැත්තාය. ඔහු කොන්ස්තන්තිනෝපලයෙන් ටියුලිප් බීජ සහ අල ගෙන්වා වගා කිරීමට පියවර ගත්තේය. මෙම ආගන්තුක පුෂ්පය ඕලන්දයේ ධනවතුන් ආකර්ෂණය කරගත්තේය. මේ අවදිය වන විට ඕලන්දයේ ආර්ථික තත්ත්වය ඉතාමත්ම ඉහළ මට්ටමේ එකක් විය. වේගයෙන් ව්‍යාප්තවූ වාණිජ කටයුතුවලින් අතිවිශාල ධනයක් ඒ වන විට මොවුන් අත එක් රැස්ව තිබිණි. නාවුක ප්‍රවාහනයේ දියුණුව හරහා පෙරදිග රටවල් සමඟ කළ වෙළෙඳාමෙන් ඉපයූ විශාල ධනස්කන්ධයක් ඔවුන් සතුවිය. ධනයෙන් හා ආර්ථික ශක්තියෙන් යුරෝපයේ බලවත් ම ජාතිය බවට ඔවුහු පත්ව සිටියහ. 17 වන ශත වර්ෂයේ යුරෝපයේ වෙළෙඳාමේ ගාමක බලවේගය වූයේ ලන්දේසීන් ය. එමෙන් ම අන්තර් ජාතික වෙළෙඳාමේ මහා මධ්‍යස්ථානය ඇම්ස්ටර්ඩෑමය විය. එය බටහිර යුරෝපයේ නගර අතරින් ධනවත්ම නගරය බවට පත්වී තිබිණි. ඕලන්ද පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම (VOC - Verenigde Oost-Indische Compagnie), (Dutch East India Company) නෙදර්ලන්තයේ වෙළෙඳාමේ මර්මස්ථානය විය. නෙදර්ලන්තයේ ශාස්ත්‍රීය කලා ශිල්ප, විද්‍යා, වාණිජ ආදී සියලු ක්ෂේත්‍රයන් හි දීප්තිමත් යුගයක් වූ මෙ කල ලන්දේසීන් ගේ ස්වර්ණමය යුගය (Dutch Golden Age) ලෙස සැලකේ. ධනවත් වෙළෙන්දන්ගේ පාරාදීසයක් බඳුවූ ඇම්ස්ටර්ඩෑම්හි මෙම සෞභාග්‍ය කලාශිල්ප, ගෘහ නිර්මාණ ශිල්පය වැනි බොහෝ දෙයින් නිරූපනය විය. යුරෝපයට එතුවක් නොලැබුණු මිණි, මුතු, ඇත් දළ ආදී බොහෝ විසිතුරු, මහාර්ඝ සම්පත් ලන්දේසි වෙළෙන්දන් හරහා ලැබිණි. පෙරදිග ඉන්දියා වෙළෙඳාමේ දී ඇම්ස්ටර්ඩෑම් වෙළෙන්දෝ එක් සමුද්‍ර චාරිකාවකින් සියයට 400 ක් තරම් ලාභ ඉපයීමට සමත් වූහ. වෙළෙඳාමෙන් සේ ම දේශ ගවේශනයේ මුවාවෙන් කෙරුණු ආක්‍රමණ සහ යටත් විජිත ඇතිකර ගැනීම මඟින් එම රටවල



කොන්රැඩ් ජෙස්නර්

සැප සම්පත් කොල්ලකෑහ. ධනවතුන්ගේ නිවෙස් විසිතුරු දැයින් විචිත්‍රවත් විය. මේ විචිත්‍රත්වය අතරට පිවිසි ආගන්තුක ටියුලිප් මල ධනවතුන් අතර ඉතාමත්ම වේගයෙන් ජනප්‍රිය වන්නට විය. සිය ගෙවුයන් සුපුෂ්පිත ටියුලිප් මලින් පිරෙනු දැක්ම ඔවුන්ගේ සිහිනයක් විය. මේ නිසා ටියුලිප් සඳහා වූ ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ යන්නට පටන් ගත්තේය. ඇම්ස්ටර්ඩෑම් හි ධනවත්තු කොන්ස්තන්තිනෝපලයෙන් ටියුලිප් බීජ සහ අල මිලදීගත්හ. ඒත් සමඟම ටියුලිප් මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ නැඟීමට පටන් ගත්තේය. මෙකල ටියුලිප් හිමිකරුවෙක් වීම සමාජයේ එකිනෙකාගේ තරාතිරම නිර්ණය කරන්නක් ලෙස සැලකිනි. ටියුලිප් පිළිබඳ එවකට සමාජයේ පැවති ආකල්පය කිනම් ආකාරයේ එකක් විනිද යත් 1634 දී ටියුලිප් එකතුවකින් තොර ධනවතුන් කෙතෙක් ධනයෙන්, සැපසම්පතින් ආඪ්‍ය වුවද කිසිදු රසඥතාවකින් තොර පිරිසක් ලෙස අවඥාවට ලක් විය. මෙකල විසූ බොහෝ උගතුන්, වියත්තු, කීර්තිධරයෝ දැඩි ටියුලිප් ලෝලීහු වූහ. De Constantia (On Constancy) ග්‍රන්ථයෙහි කතුවරයා වූ ජොසේ ලිප්ස් (Joose Lips) වැන්නෝ මේ අය අතර සිටියහ.

## ටියුලිප් උන්මාදයක් බවට පෙරළෙයි

ටියුලිප්වලට සමාජයේ ඇතිවූ පිළිගැනීමත් සමඟ බොහෝ දෙනෙක් ඒවා පසුපස හඹායන්නට වූහ. තවදුරටත් එය ධනවතුන්ට සීමාවූවක් නොවීය. මෙයින් මධ්‍යම පංතිකයෝ දැඩි පීඩාවට පත්වූහ. සාමාන්‍ය ආදායම් ලබන වෙළෙන්දෝ, සාප්පු හිමිකරුවෝ පවා ටියුලිප් අයිතිකරුවන් වීමට ඔවුනොවුන් හා තරඟ වදින්නට වූහ. ඒවා මිලදී ගැනීමට ඉතාමත් ම අස්වාභාවික අයුතු මිල ගණන් ගෙවන්නට වූහ. හර්ලම්වල (Harlaem) වෙළෙන්දෙක් සිය ජීවිත කාලය තුළ ඉතිරි කළ මුදලින් අඩක් ම එකම එක ටියුලිප් අලයක් මිලදී ගැනීමට වැයකර ඇත. එහෙත් ඒ ලාබ ලැබීමේ අපේක්ෂාවෙන් නොවේ. හුදෙක් හිතමිතුරන් ගේ බුහුමන් ලැබීමට ය. ඔවුන් ගේ ඇගයීමට පාත්‍රවීමටය.

ටියුලිප් උන්මාදය පිළිබඳව පළමුවරට කෘතියක් ලියා පළ කළේ ස්කොට්ලන්ත ජාතික ලේඛකයෙක් වූ චාල්ස් මැකේ (Charles Mackay) ය. ඒ 1841 දීය. කෘතිය Extraordinary Popular Delusions and the Madness of Crowds ය. ටියුලිප් උන්මාදය පිළිබඳ බොහෝ තොරතුරු මේ මඟින් වඩාත් ප්‍රචලිත විය. ඔහු සඳහන් කරන පරිදි ටියුලිප්වලට පැවති ඉල්ලුම කෙතෙක් වීද යත් එක් ගැනුම්කරුවෙක් ටියුලිප් අලයක් ලබාගැනීමට අක්කර 12ක ඉඩමක් කැපකොට ඇත. ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය අර්ල් තොම්සන් (Earl Thompson)



ටියුලිප් වගා බිමක්


ඔහුගේ The Tulipmania: Fact or Artifact ලිපියෙහි සඳහන් කළ පරිදි 17 වන ශත වර්ෂයේ ඇම්ස්ටර්ඩෑම්වල අංග සම්පූර්ණ සුඛෝපභෝගී නිවසක වටිනාකමටත් වඩා ටියුලිප් අලයක මිල ගණන් ඉහළ ගොස් ඇත.

රෝස, ස්වීට් පී (Sweet Pea) වැනි මල් ටියුලිප්වලට වඩා සුවඳවත් ය. සුන්දර ය. එහෙත් ඒ කිසිදු මලකට හිමිනොවූ ස්ථානයක් ටියුලිප් මලට හිමිවිය. මේ නිසා ඕලන්දයේ ටියුලිප්වල ජනප්‍රියතාව විස්තර කළ නොහැකි එකක් බව සමහරුන් ගේ අදහසයි. ඕලන්දයට පැමිණි ටියුලිප් මල එකී පරිසරය තුළ එහි ස්වභාවික සුන්දරත්වය ඉක්මවා ගියේය. එය වගාවක් ලෙස නොකරන කාලයෙහි එනම්, ස්වභාවික තත්ත්වය යටතේ තනි වර්ණයකින් යුත් මල් විය. විශාල පත්‍ර සහිත විය. අසාමාන්‍ය දිගු නටුවක් සහිත විය. ආගන්තුක පුෂ්පය ඕලන්දයට පිවිස කෙටි කලකට පසු එය හානිකර නොවන විචිත්‍රකාරක වෛරසයක (Mosaic Viruses) ආසාදනයට ලක්විය. වෛරස් ආසාදනයකට ලක්වූ ටියුලිප් සාමාන්‍ය තත්ත්වයට වඩා බොහෝ සෙයින් වෙනස් විය. ඒවායේ පැහැය මෙන් ම ස්වභාවය ද වෙනස් විය. තනි වර්ණය වෙනුවට නා නා වර්ණයෙන් ජ්වලිත ටියුලිප් බිහිවිය. පෙති කුඩා විය. වර්ණවත් රටා සහිත විය. පත්‍ර මෘදු ළා කොළ පැහැති විය. ඕලන්දය තුළ මෙසේ පරිවර්තනයට ලක් වූ ටියුලිප් මල්කරුවන් ගේ ඇසට වඩාත් ප්‍රසන්න විය. ආකර්ශණීය විය. 1620 - 1630 ගණන් වන විට මෙසේ විවිධත්වයට පත්වූ ටියුලිප් වර්ග රැසක් තිබිණි. 1637 උමතුවෙහි උච්ච අවස්ථාව වන විට මෙසේ බිහිවූ ටියුලිප් වර්ග 500 ක් පමණ තිබිණි.

ඕලන්දය තුළ බිහිවූ ටියුලිප් වර්ග සඳහා විවිධ නම් පටබැඳිනි. බොහෝවිට වැවිලිකරුවන්ගේ නම් ද සමුද්‍ර තරණයෙහි සහ යුධ කටයුතුවල කැපීපෙනෙන හපන්කම් දැක්වූවන් ගේ නම් ද මේවාට ආරෝපණය කළහ. උදා: අද්මිරාල් ලීෆ්කන්, අද්මිරාල් වොන් ද අයික් මෙසේ නම් කරන ලද ටියුලිප් වර්ග කිහිපයකි. ඇතැම් විටෙක මලට වඩාත් සුපිරි තත්ත්වයක් ආරෝපණය කිරීමට මහා ඇලෙක්සැන්ඩර් (Alexander the Great), සිපිඕ (Scipio), අද්මිරාල්වරුන් ගේ අද්මිරාල් (Admiral of Admirals ), ජනරාල්වරුන් ගේ ජනරාල් (General of Generals) වැනි සුපිරි නම් යෙදූහ.

මෙසේ ටියුලිප් වර්ග රැසක් තිබුණ ද ඒ සෑම වර්ගයක් සඳහා ම පැවති ඉල්ලුම එක හා සමාන වූයේ නැත. එම නිසා ම එක් එක් වර්ගවල මිල ගණන් ද එකිනෙකින් වෙනස් විය. ළා පැහැති පසුබිමක දීප්තිමත් තද වර්ණයෙන් යුතු ඉරි සහිත ටියුලිප් වර්ග වඩාත් ආකර්ශණීය විය. මිල අධිකම ටියුලිප් වර්ගය වූයේ සෙම්පර් ඔගස්ටස් ය. මෙකල ටියුලිප් අල අලෙවිකරන ලද්දේ බර කිරාය. බර මනින ඒකකය වූයේ පෙරිට් (Perit) ය. පෙරිට් යනු ඉතා කුඩා බරකි. එය ග්‍රේන් 1 කටත් වඩා අඩු ප්‍රමාණයකි. (ග්‍රේන් 1 = මංචාඩියෙන් ¼) ග්‍රේන් 480 ක් අවුන්ස 1 කි. අද්මිරාල් ලීෆ්කන් (Admiral Liefken) වර්ගයේ ටියුලිප් පෙරිට් 400 ක බරක් ගිල්ඩර් 4400 ක් ද අද්මිරාල් ෆොන් ද අයික් (Admiral Von der Eyk) වර්ගය පෙරිට් 446 ක බරක් ගිල්ඩර් 1260 ක් ද ෂිල්ඩර් (Shilder) පෙරිට් 106 ක බරක් ගිල්ඩර් 1615 ක් ද වයිස්රෝයි (Viceroy) පෙරිට් 400 ක බරක් ගිල්ඩර් 3000 ක් ද සෙම්පර් ඔගස්ටස් (Semper Augustus ) පෙරිට් 200 ක බරක් ගිල්ඩර් 5500 ක් ද මිල විය.

1636 මුල මුලු ඕලන්දයටම සෙම්පර් ඔගස්ටස් වර්ගයේ ටියුලිප් අල තිබී ඇත්තේ 2 ක් පමණි. ඒවාද එපමණ හොඳ තත්ත්වයේ අල නොවුනි. ඉන් එකක් ඇම්ස්ටර්ඩෑම්වල වෙළෙන්දෙක් ළඟ ද අනෙක හර්ලම්වල ද තිබිණි. මේ නිසා මෙම සෙම්පර් ඔගස්ටස් ටියුලිප් අල හිමිකර ගැනීමට ටියුලිප් ලෝලීන් තුළ දැඩි පෙළඹීමක් තියුණු තරඟයක් ඇති විය. අවසන හර්ලම්වල ටියුලිප් අලය ලබා ගැනීමට ගැනුම්කරුවෙක් ගොඩනැගිලි සහිත අක්කර 12 ක් වූ තම ඉඩම කැප කළේය. ඇම්ස්ටර්ඩෑම්වල අලය ගිල්ඩර් 4600, අළුවන් අශ්වයන් සහිත අංග සම්පූර්ණ අශ්ව කරත්තයකට මිල විය. 1637 පෙබරවාරියේ මිල ගණන් ඉහළටම නැගි අවස්ථාවේ ඇතැම් ටියුලිප් වර්ගයක අලයක මිල පුහුණු කාර්මික ශිල්පියෙකු වාර්ෂිකව උපයන ආදායම මෙන් 10 ගුණයකටත් වඩා විශාල විය. මෙකල ප්‍රකට කතුවරයෙක්ව සිටි මන්ටින් (Munting) ටියුලිප් ප්‍රේමය (Tulipomania) ගැන පුරා පිටු 1000ක් ලීවේය. එක් වයිස්රෝයි ටියුලිප් අලයක් ලබාගැනීම සඳහා විකුණන ලද ද්‍රව්‍ය ලැයිස්තුවක් ඒවායේ වටිනාකම් සහිතව එහි වාර්තා වේ.


ටියුලිප් අල

| විකුණන ලද ද්‍රව්‍ය | වටිනාකම (ගිල්ඩර්) |
|---|---|
| තිරිඟු ටොන් 4 | 448 |
| රයි ටොන් 8 | 558 |
| තර ගොන්නු 4 | 480 |
| තර ඌරෝ 8 | 240 |
| තර බැටළුවෝ 12 | 120 |
| වයින් ලේගර ( පීප්ප) 2 | 70 |
| බීර පීප්ප 4 | 32 |
| බටර් ටොන් 2 | 192 |
| අංග සම්පූර්ණ ඇඳක් | 100 |
| සම්පූර්ණ ඇඳුම් කට්ටලයක් | 80 |
| රිදියෙන් කළ බීම බඳුනක් | 60 |
| **එකතුව** | **2500** |

ටියුලිප් ඉල්ලුම කෙතෙක් ඉහළ ගිය ද එය සපුරාලීමට ප්‍රමාණවත් සැපයුමක් නොවිණි. මන්ද, ටියුලිප් වගාකර ඉතා කෙටි කාලයකින් මල් අස්වැන්න නෙලාගත නොහැකිවූ නිසාය. සාමාන්‍යයෙන් ටියුලිප් බීජයක් පැළවී වැඩී මල් පිපීමට අවුරුදු 7- 12ක් පමණ කල් ගතවේ. ටියුලිප් අල මඟින් ඊට වඩා අඩු කාලයකින් එනම් අවුරුදු 1 - 3 තරම් කාලයකින් මල් ලබා ගැනීමට හැකි වුවත් අලයකින් වසරකට ලබාගත හැකි වූයේ අලුත් මොරෙයියන් දෙකක් හෝ තුනක් හෝ පමණි. ඉල්ලුම අධික වෛරස් ආසාදිත ටියුලිප් මල් බීජ මඟින් ලබාගත නොහැකි විය. ඒවා ටියුලිප් අල වගාවෙන් ලබාගත් මොරෙයියන් ගෙන් ම ලබා ගත යුතු විය. එහෙත් වෛරස් ආසාදිත ටියුලිප් අල ඉතා දුර්වල ඒවා විය. ඒ නිසා ඒවායින් ලබා ගතහැකි වූයේ ඉතා සීමිත මොරෙයියන් ගණනකි.

### අලෙවි ක්‍රමවල වර්ධනය

සාමාන්‍යයෙන් අප්‍රේල් සහ මැයි අතර සතියක පමණ කාලයකට ටියුලිප් මල් පිපෙයි. ජූනි - සැප්තැම්බර් කාලය ටියුලිප් අල පැළ නොවෙයි. මෙම කාලයෙහි අල ගලවා එතැන් වෙළෙඳපොළෙහි (Spot Market) ඒවා විකිනීම සිදුවිය. වසරේ ඉතිරි කාලයේ මල්කරුවෝ හෝ ටියුලිප් වෙළෙන්දෝ හෝ නොතාරිස්වරු ඉදිරිපිට කන්නය අවසානයේ ටියුලිප් මිලදී ගැනීමට ගැනුම්කරුවන් සමඟ අනාගත ගිවිසුම් (Future Contracts) අත්සන් කළහ. නූතන මූල්‍ය සහ වෙළෙඳ ක්‍රමවල නොයෙකුත් තාක්ෂණික විධික්‍රම වර්ධනය කළ ලන්දේසීහු ටියුලිප් සඳහා මෙසේ විවිධ ස්වරූපයේ වෙළෙඳපොළ ඇති කළහ. වෙළෙඳාමේදී මතුවන ගැටලු අවම කිරීම සඳහාත් වෙළෙඳාම විධිමත් කිරීම සඳහාත් 1610 සිට ඉදිරි විකුණුම් (Short Selling) තහනම් කෙරෙන නියෝග පනවා ඇත. 1621,1630 සහ 1636 දී මෙම නීති නැවත බලගන්වා ඇත. මෙම නියෝග යටතේ ඒවා පිළි නොපැදි ඉදිරි අලෙවිකරුවන්ට එරෙහිව නෛතික පියවර නොගත්තද ඔවුන් ඇතිකර ගත් ගිවිසුම් බල රහිත තත්ත්වයට පත්විය.

ටියුලිප් වසඟයට පත් ලන්දේසීන් ගේ මෙම උමතුව 1634 පමණ වන විට ඔවුන්ගේ දෛනික වැඩකටයුතු මුලුමනින් ම අවුල්කර දැම්මේය. සමාජයේ ඉතා සුළු පිරිසක් පමණක් ටියුලිප් වෙළෙඳාමට සම්බන්ධ වුව ද එහි බලපෑම සමස්ත සමාජය පුරාම ව්‍යාප්ත වන්නට විය. උමතුව දිනෙන් දින උච්චස්ථානයට ගමන් කරද්දී මිල ගණන් ද ඇදහිය නොහැකි තරම් වේගයෙන් ඉහළ නගින්නට විය. විශේෂයෙන්ම වෛරස් ආසාදිත වෛරම් සහිත මල් පිපෙන ටියුලිප් අලවල මිල ගණන් ඉතාමත් ම ඉහළ නැගුනේය. 1634 ප්‍රංශයෙන් ටියුලිප් සඳහා ඇතිවූ ඉල්ලුමත් සමඟ සමපේක්ෂකයෝ රැසක් ටියුලිප් වෙළෙඳපොළට ඇතුලු වූහ. 1635 දී ටියුලිප් බීජ 40 ක් හිමිකර ගැනීමට මිනිස්සු ගිල්ඩර් 100,000 ක් තරම් ධනස්කන්දයක් වැයකරමින් සිටියහ.

### තැරැව්කරුවන්ගේ මැදිහත්වීම

ආරම්භයේදී ගැනුම්කරුවෝ වූයේ ටියුලිප් මල්වලට ප්‍රිය කළෝය. නමුත් ඉතා වේගයෙන් ටියුලිප් මිල ගණන් ඉහළ යද්දී පසුව මෙම ගනුදෙනුවලට අවතීර්ණ වුවෝ ලාභ ඉපයීමේ චේතනාවෙන් ම ඊට පිළිපන්හ. ටියුලිප් අල, කොටස් වෙළෙඳපොළේ අලෙවි වන කොටස් බවට පරිවර්තනය විය. ටියුලිප් අල මිලදී ගත් බොහෝ ගැනුම්කරුවන් තුළ ඒවා වගාකිරීමේ කිසිදු අදහසක් නොවුනි. තවදුරටත් ඒවා කෘෂි බෝගයක් හෝ උද්‍යාන බෝගයක් හෝ නොවුනි. අඩු මිලට මිලදී ගෙන වැඩි මිලකට අලෙවිකිරීම ගැනුම්කරුවන්ගේ උත්සාහය විය. ඉවක් බවක් නැතිව කටයුතු කිරීමට පටන් ගත්හ. එක ටියුලිප් අලයක් ලබා ගැනීමට ඉතාමත් ම වටිනා වත්කම් නොවටිනා මිලට අලෙවිකළහ. වත්මන් මිල

ගණන් අනුව ඩොලර් 17000 - 76000 ක් තරම් ගණනක් එකම ටියුලිප් අලයක් මිලදී ගැනීමට යෙදවීමට තරම් ඔවුහු මුලාවක වැටී සිටියහ.

1636 දී දුර්ලභ ටියුලිප් වර්ග සඳහා වූ ඉල්ලුම ඉතා තියුණු ලෙස ඉහළ ගියේය. ඒවා ඇම්ස්ටර්ඩෑම් කොටස් වෙළෙඳපොළේ (Amsterdamzs Stock Exchange) ද රොටර්ඩෑම් (Rotterdam), හර්ලම්, ලේඩන් (Leyden), අල්ක්මාර් (Alkmar), හෝන් (Hoorn) සහ වෙනත් නගරවලද අලෙවි වන්නට විය. 1636 නොවැම්බර් වන විට දුර්ලභ විචිත්‍ර වර්ණවත් ටියුලිප් වර්ගවල පමණක් නොව සාමාන්‍ය ටියුලිප් අලවල පවා මිල ගණන් ඉහළ ගියේය. මේ වසරේදී ලන්දේසීහු කන්නය අවසානයේ ටියුලිප් අල මිලදී ගැනීමට හා විකිනීමට ගිවිසුම් අත්සන්කරන විධිමත් අනාගත ඉදිරි වෙළෙඳපොළක් (Future Market) නිර්මාණය කළහ. ටියුලිප් වෙළෙඳාම ඉතාමත් ම පුළුල් විය. ගනුදෙනුකරුවන්ට මග පෙන්වන නීතිරීති පැනවිනි. මාර්ගෝපදේශ සෑදිනි. නිලධාරීන් වූයේ ද ටියුලිප් වෙළෙඳාම හා සම්බන්ධ වූ අයමය. ටියුලිප් වෙළෙඳාම සඳහා හුවමාරු මධ්‍යස්ථාන (Official Tulip Exchange) නොතිබුණු කුඩා නගරවල ප්‍රධාන තානායම ටියුලිප් ප්‍රදර්ශනාගාර ලෙස යොදා ගැණිනි. සුපුෂ්පිත ටියුලිප් මලින් සැරසුනු මල් බඳුන් තානායමෙහි ඉඩකඩ ඇති තැන්වල ප්‍රදර්ශනය සඳහා තබා තිබිණි. ගනුදෙනු පිළිබඳ කතිකා කිරීමට, ගිවිසුම් වලට එළැඹීමට, ගිවිසුම් අත්සන් කිරීමට ගනුදෙනුකරුවෝ මෙම තානායම්වලදී හමුවූහ. එක් එක් එක් පුද්ගලයා තම තමන් කතිකා කොටගත් ආකාරයෙන් ගිවිසුම්වලට එළැඹුනහ. වෙළෙඳාමේදී භෞතික වශයෙන් ටියුලිප් අල හුවමාරු නොවුනි. මේ නිසා මෙම වෙළෙඳාම සුළං වෙළෙඳාමක් (Wind Trade) ලෙස ඇතැම්හු හැඳින්වූහ. 1636 - 37 සිසිර කාලය වන විට ටියුලිප් උන්මාදය උච්ච අවස්ථාවට පත්විය. සමහරක් ටියුලිප් අල දිනකට දහ වතාවක් පමණ හුවමාරු විය. මේ හාම ප්‍රථම වතාවට දූ කෙළියේ ලකුණුද පහළ වන්නට විය. කොටස් තැරැව්කරුවෝ ටියුලිප් සම්බන්ධව නව ආයෝජන අවස්ථා පිළිබඳව නිරන්තර අවධානයෙන් පසුවූහ. ඔවුහු මිල උච්චාවචනය වීමට ඉඩ සැලසීමට සෑම උත්සාහයක්ම, සෑම උපක්‍රමයක්ම යෙදූහ. ආරම්භයේදී අනෙකුත් සෑම සූදුවකදී මෙන් ම මෙහිදී ද සෑම අයෙක් තුළම ජයග්‍රහණය සහ ප්‍රතිලාභ පිළිබඳව දැඩි විශ්වාසයක් විය. මින් පල නෙලා ගත්තෝ කොටස් තැරැව්කරුවෝය. ඔවුහු මිල ගණන් අඩු අවස්ථාවල ටියුලිප් මිලදී ගෙන මිල ගණන් ඉහළ ගිය අවස්ථාවල ඒවා විකිණීමෙන් ඉමහත් ලාභ ලැබූහ.

ක්‍රම ක්‍රමයෙන් මෙම උමතුව ඕලන්ද දේශ සීමාව ඉක්මවා පැතිරී යන්නට විය. අපේක්ෂා කළ ලෙසින් ම ඕලන්දය දෙසට මුදල් ගලා එන්නට විය. එහි අනිවාර්ය ප්‍රතිපලය ලෙස උද්ධමනය ද බියකරු ලෙස හිස ඔසවන්නට විය. අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉතාමත්ම තියුණු ලෙස ඉහළ ගියේය. නිවාස සහ ඉඩම්, අශ්වයින් සහ කරත්ත ඇතුලුව සුඛෝපභෝගී භාණ්ඩවල ද වටිනාකම ඉහළ ගියේය.

බොහෝ පිරිසක් හිටිහැටියේ මහා ධනවතුන් බවට පත්වූහ. පැනි බඳුනකට කූඹින් රැස්වන්නා සේ මිනිසුන් ටියුලිප් වෙළෙඳාමට පොරකෑහ. ටියුලිප්වලට ඇති ඉල්ලුම, ලැදියාව කිසිදු දින නැති නොවෙතැයි, සදාකල් පවතිනු ඇතැයි ඔවුන් අදහස් කළා වැනි විය. ලොව පුරා සිටින ධනවතුන් ඕනෑම මිලකට ඕලන්දයෙන් ටියුලිප් මිලදී ගනු ඇතැයි ඔවුහු විශ්වාස කළහ. යුරෝපීය ධනවතුන් දකුණු මුහුදු (Zuiderzee) වෙරළෙහි රැස්කනු ඇත. ඔවුන් දුප්පත්කම ඕලන්දයෙන් පළවාහරිනු ඇතැයි ලන්දේසීහු සිහින දුටුහ. වංශාධිපතියන්, කුලීනයන් පමණක් නොව නාගරිකයන්, ගොවියන්, කාර්මිකයන්, නැවියන් ආදී සමාජයේ මෙකී නොකී සියලුම තරාතිරම්වල අය ටියුලිප් ගනුදෙනුවලට මැදිහත්වූහ. ටියුලිප් තවදුරටත් සමාජයේ තම තත්ත්වය විදහා පෙන්වන සංකේතයක් පමණක් නොවුනි. එය ධනය උනා එන උල්පතක් ලෙස සැලකිනි. මිනිස්සු තමන් සන්තක දේපළ මුදල්වලට හරවා හෝ නොහරවා හෝ ඒවා ටියුලිප්වල ආයෝජනය කළහ. මේ නිසා නිවාස සහ දේපළ ඉතාමත් අඩු මිල ගණන්වලට තක්සේරුවන්නට විය. මහා මූඪ න්‍යාය (Great Fool Theory) ක්‍රියාත්මකවන්නට විය. ඒ අනුව ටියුලිප් ගැනුම්කරුවෝ ඒවන විට ටියුලිප් මිලදී ගත්තේ ඒවා එම මිලට වටිනා නිසා නොව නොවටිනා බව දැන දැනම ඊටත් වඩා ඉහළ මිලකට එය වෙනත් අයෙකුගේ ඇඟේ ගැසීමට හැකිවේය යන බලාපොරොත්තුවෙනි.

**සිහිනය බිඳවැටෙයි**

ටියුලිප් සිහිනයේ වෙලුනු බොහෝ දෙනෙක් සිතූ ලෙස මෙය සදාකල් සුවය ගෙන දෙන්නක් නොවීය. ශූර තැරැව්කරුවෝ තමන් සන්තකයේ තබාගෙන සිටි ටියුලිප් වෙළෙඳපොළට මුදා නොහැර හිඟයක් මවා පාමින් තව තවත් මිල ගණන් ඉහළ යෑමට සලස්වා අතිවිශාල ධනස්කන්ධයක් ඉපයූහ. එහෙත් මෙය සැමදා කළ නොහැකි විය. ටියුලිප් තව දුරටත් දුර්ලභ නොවීය. වගාව මඟින් නෙලාගත් අස්වන්න වෙළෙඳපොළට නිකුත්කිරීමත් තැරැව්කරුවෝ තමන් සන්තකයේ තබාගෙන සිටි ටියුලිප් අල වෙළෙඳපොළට නිකුත් කිරීමත් සමඟ සැපයුම ඉහළ ගියේය. එමෙන්ම මෙම අඥාන කටයුත්තෙහි කෙළවර ඇති අනතුර නුවණැති සිත්වලට වැටහෙන්නට ද විය. මේ අවදිය වනවිට ධනවතුන් ටියුලිප් උන්මාදයේ ආරම්භක අවස්ථාවේ මෙන් ටියුලිප් මිලදී ගත්තේ තම උද්‍යාන අලංකරණයට හෝ තම සමාජ තත්ත්වය විදහා පෙන්වීමට හෝ නොවේ. ඒවා නැවත විකුණා ලාභ ලැබීමේ අපේක්ෂාවෙනි. මෙම කටයුතු අවසානයේදී යම් යම් අය නිශ්චිතවම ඉතාමත්ම අවාසනාවන්ත ඉරණමකට ගොදුරුවන බැව් ටියුලිප් ගනුදෙනුවලට සම්බන්ධ වූ ඇතැමෙකුට වැටහෙන්නට විය. මෙම අවබෝධය, දැනුම ඔවුන් අතර පැතිරී යෑමත් සැපයුම වැඩිවීමත් සමගම ටියුලිප් මිල ගණන් පහළ වැටෙන්නට විය. මේ නිසා ටියුලිප් සඳහා වූ වෙළෙඳපොළ බිඳවැටෙන ලකුණු පහළ වන්නට විය. මිල ගණන් ඉහළ නැගුනාටත් වඩා වේගයෙන් පහළ වැටෙන්නට විය. එතැන් සිට නැවත කිසිදු දිනක ටියුලිප් මිල ගණන් ඉහළ නැගුනේ නැත. එය ක්‍රමානුකූලව සෙමින් සිදුවූවා නොවේ. එක්වරම 1637 පෙබරවාරියේ ටියුලිප් මිල ගණන් ඉතාමත්ම වේගයෙන් පහළ වැටිනි. සති 6 ක් තුළ ටියුලිප් මිල ගණන් සියයට 90 කින් පහළ වැටිණි. ඒත් සමඟම ටියුලිප් වෙළෙඳාම පතුලටම ඇද වැටිණි. බිඳවැටීම ආරම්භවූයේ හර්ලම්වලය. එහි ටියුලිප් අල වෙන්දේසියේදී පළමුවතාවට ගැනුම්කරුවෝ ඉදිරිපත්වීම ප්‍රතික්ෂේප කළහ. එක් දිනක ඇති වූ මෙම සිදුවීම රට පුරාම පැතිරෙන්නට විය. වෙළෙන්දෝ ඉල්ලුම වැඩිකිරීමට කෙතෙක් උත්සාහ ගත්තද එය සාර්ථක වූයේ නැත. සති කිහිපයකට පෙර ගිල්ඩර් 5000 ක් වූ මල්වල මිල ගිල්ඩර් 100 ක් තරම් පහළට වැටුනේය.

ටියුලිප් ගනුදෙනු සම්බන්ධව එතෙක් පැවති විශ්වාසය මුලුමනින්ම බිඳ වැටුණි. ගනුදෙනුකරුවෝ කලබලයෙන්, සංත්‍රාසයෙන් මුසපත් වූහ. මහා ව්‍යසනයක පෙරනිමිති පහළ වන්නට විය. වෙළෙඳ ගිවිසුම් කඩකිරීම් පිළිබඳව සතර අතින් වාර්තා වන්නට විය. මින් එක් අවස්ථාවක ගැනුම්කරුවෙක් වෙළෙන්දෙකු ගෙන් එකක් ගිල්ඩර් 4000 ක මිලට සෙම්පර් ඔගස්ටස් ටියුලිප් අල 10ක් මිලදී ගැනීමට එකඟව සිටියේය. ගිවිසුම අත්සන් කර සති 6ක් ඇතුළත ගනුදෙනුව සිදුකළ යුතු විය. නියමිත වේලාවට ගනුදෙනුව කිරීමට වෙළෙන්දා සූදානම් වුවත් ඒවන විට මිල ගණන් ගිල්ඩර් 4000 සිට 300 හෝ 400 හෝ දක්වා පහළ වැටී තිබිණි. මේ නිසා ගැනුම්කරු මිල ගෙවීම හෝ ටියුලිප් මිලදී ගැනීම හෝ ප්‍රතික්ෂේප කළේය. දිනපතා ඕලන්දයේ සෑම නගරයකින්ම මෙවැනි ගිවිසුම් කඩකිරීම් පිළිබඳව වාර්තා වන්නට විය.

සමස්ත ඕලන්දයෙන්ම දිළිඳුකම පලායනු ඇතැයි විශ්වාස කළ බොහෝ දෙනෙකුට අවසන, දේපළ ඉඩකඩම් විකුණා විශාල වියදමක් දරා හිමිකරගත් නොවටිනා ටියුලිප් අල කිහිපයක් පමණක් හිමි අන්ත දිළින්දන් බවට තමන් පත්ව ඇති බැව් වැටහෙන්නට විය. ඒත් සමගම සෑම දෙසකින් ම අර්බුදයේ අසහනය දෝංකාර දෙන්නට විය. එකිනෙකා එකිනෙකාට චෝදනා අපවාද නගන්නට වූහ. මිල ගණන් ඉතාමත්ම ඉහළ ගිය අවස්ථාවල ටියුලිප් අල විකුණා ගැනීමට සමත් වූවෝ කිහිප දෙනෙක් තම ධනය වෙනත් වෙළෙඳපොළවල ආයෝජනය කළහ. ඇතැමෙක් හදිසියේම ලැබුණු සමෘධිමත් බව අහිමිව ගොස් නැවත පෙර සිටි තත්ත්වයටම ඇද වැටුනහ. කුලීන පවුල්, විශාල ව්‍යාපාරිකයෝ දිළින්දන්ටත් වඩා අන්ත දිළින්දන් බවට පත්වූහ.

අර්බුදකාරී අවස්ථාවට කෙසේ මුහුණ දිය යුතුද, කටයුතු කළ යුත්තේ කෙසේද යන්න සොයා බැලීමට සාකච්ඡා කිරීමට ටියුලිප් හිමියෝ ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වූහ. ඔවුන් ගේ නියෝජිතයෝ විසඳුම් සොයා ඇම්ස්ටර්ඩෑම් රජය වෙත ගියහ. මෙම කටයුතුවලට මැදිහත්වීම මුලදී රජය ප්‍රතික්ෂේප කළේය. ඔවුනොවුන් අතර සාකච්ඡා කොට සැලැස්මකට එකඟවන ලෙස රජය අවවාද කළේය. මේ සඳහා රැස්වීම් වාර බොහෝ ගණනක් පැවැත් වුව ද ඒ සියල්ලම අවසන් වූයේ ඉතාමත්ම අවාසනාවන්ත ලෙසය. කලබල මැදය. අඬදබර, කල කෝලාහල රැසකට පසු ඔවුහු තීරණයකට එළැඹීමට සමත් වූහ. ඒ, උන්මාදයේ උච්චතම අවස්ථාවේ හෝ 1636 නොවැම්බරයට පෙර හෝ ඇතිකරගන්නා ලද සියලුම ගිවිසුම් බලරහිත සහ අවලංගු බවටත් එදිනට පසු ඇතිකර ගන්නා ලද ගිවිසුම් සම්බන්ධව ගැනුම්කරු ගිවිසගත් ගෙවීම් වටිනාකමෙන් සියයට 10ක් අඩු කොට විකුනුම්කරුට ගෙවීමටත්ය.

එහෙත් මෙම තීරණය ද සතුටුදායක එකක් වූයේ නැත. මිල ගණන් ඉහළ ගිය විට අලෙවි කිරීමට ටියුලිප් අල ළඟ තබාගෙන සිටි වෙළෙන්දන් අඩු මිල ගණන් යටතේ ටියුලිප් අලෙවි කිරීමට අකමැති වීම ස්වභාවිකය. මිලදී ගැනීමට ගිවිසුම් ඇතිකරගෙන සිටි ගැනුම්කරුවන් ද සියයට 10 ක් අඩුවෙන් ගෙවීමේ මෙම තීරණයෙන් සතුටට පත්වූයේ නැත. මන්ද, ඒ වනවිට ටියුලිප් මිල ගණන් ගිවිසගත් මිලට වඩා බෙහෙවින් පහළ වැටී තිබුණු බැවිනි. මේ නිසා ගිවිසුම් කඩකිරීම් සම්බන්ධව ඇතිවූ ආරාවුල් පිළිබඳව රටේ සෑම ප්‍රදේශයකින් ම පාහේ උසාවිවලට පැමිණිලි ගලා එන්නට විය. එහෙත් ටියුලිප් ගනුදෙනු සූදුවක් ලෙස සලකා ඒවාට මැදිහත්වීම උසාවි ප්‍රතික්ෂේප කළේය. දිනෙන් දින මෙම තත්ත්වය උණුසුම් අතට හැරෙද්දී හේග් (Hague) පළාත් කවුන්සිලයට මෙම ගැටලුව යොමු විය. එහෙත් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා තෙක් මාස තුනක් ගතවෙන තුරු අවසාන තීරණය දීමට එයට නොහැකි විය. ඒ අතරතුර සෑම විකුණුම්කරුවෙක්ම සාක්ෂිකරුවන් ද සහිතව කලින් ගිවිසගත් මිලට ගැනුම්කරුට ටියුලිප් ලබාදිය යුතු බවට අවවාද කළේය. යම් හෙයකින් ගැනුම්කරු එම ගිවිසගත් මිලට ඒවා මිලදී ගැනීම් ප්‍රතික්ෂේප කළහොත් ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවටත්, එවිට කලින් ගිවිස ගත් මිල හා විකුණුම් මිල අතර යම් වෙනසක් වුවහොත් එය ගැනුම්කරු විසින් ගෙවිය යුතු බවටත් තීරණය විය. එහෙත් මෙම සැලසුම ද සාර්ථක වූයේ නැත. ගෙවීම් කටයුතු සම්බන්ධව බල කළ හැකි උසාවි ඕලන්දයේ නොවීය.

ඇම්ස්ටර්ඩෑම්හි ද මෙම ප්‍රශ්නය බරපතල ලෙස උද්ගත විය. නමුත් විනිසුරුවෝ ඒවාට මැදිහත්වීම ඒකමතිකව නිශ්ප්‍රභා කළහ. මන්ද, නෛතිකව ගත් කළ එම ගනුදෙනු ණය ලෙස සැලකිය නොහැකි වූ නිසාත් ඒවා සූදු කටයුතු ලෙස සැලකුනු නිසාත් ය. අවසන ටියුලිප් ගනුදෙනු නෛතික ඒවා ලෙස නොසැලකුනු බැවින් ඒ සම්බන්ධව තීරණයක් ගැනීමට රජයට ද නොහැකි විය. මේ ලෙස ටියුලිප් උන්මාදය අවසන් විය. කෙළවර පිරිසක් කිසිදු වටිනාකමකින් තොර ටියුලිප් හිමිකරුවෝ වූහ. තවත් පිරිසක් ඒ මගින් විශාල ලාබ උපයා තිබුණ හ. මෙයින් ලන්දේසි වාණිජ ක්ෂේත්‍රය තදබල කම්පනයකට ලක්විය. එය යථා තත්ත්වයට පත්වීමට අවුරුදු ගණනාවක් ගතවිය.

ඕලන්දයේ ඇති වූ මෙම ටියුලිප් උන්මාදය තරමක් දුරට එංගලන්තයට ද පැතිරී ගියේය. 1636 දී ලන්ඩන් කොටස් හුවමාරුවෙහි ප්‍රසිද්ධියේ ටියුලිප් අලෙවි කළේය. ඇම්ස්ටර්ඩෑම්වල දක්නට ලැබුණු ආකාරයෙන් මිල ගණන් ඉහළ නැංවීමට කොටස් තැරැව්කරුවෝ බොහෝ සේ වෙහෙසුනහ. මේ හා සමානවම පැරීසියේ තැරැව්කරුවෝ ද ටියුලිප් උන්මාදයක් ඇතිකිරීමට  දැඩි ප්‍රයත්නයක් දැරූහ. කෙසේ වෙතත් මෙම නගර දෙකේම තැරැව්කරුවෝ ඕලන්දයේ තැරැව්කරුවන් තරම් සාර්ථකත්වයක් ලැබීමට සමත් වූයේ නැත.

කෙසේ වෙතත් මෙසේ ඇතිවී නැතිවී ගිය ටියුලිප් උන්මාදය විසින් ඇතිකරන ලද වෙළෙඳපොළ තුළ නව වෙළෙඳ ක්‍රම කිහිපයක උත්පාදනය සිදු විය. එමෙන්ම උද්ගතවූ නොයෙකුත් ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීමෙන් වෙළෙඳාමේදී භාවිතයට ගත යුතු විධිමත් නියාමන රාමුවල අවශ්‍යතාව ද මේ තුළින් පැන නැගුනි. එමතු නොව ක්ෂණික ලාභ අපේක්ෂාවෙන් අවිචාරශීලි ලෙස අවදානම් අධික මූලාශ්‍රවල මුදල් ආයෝජනයෙන් සිදුවීමට ඉඩ ඇති ව්‍යසන පිළිබඳ අනතුරු ඇඟවීම් ද මේ මඟින් කෙරිණි. ✪

# වර්තමාන ආර්ථික විද්‍යා සන්දර්භය තුළ
# තොරතුරු ආර්ථික විද්‍යාව

**රෝහිත අබේකෝන්**

ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, මානව සම්පත් දෙපාර්තමේන්තුව

සමාජ විද්‍යාඥයින් වශයෙන් ආර්ථික විද්‍යාඥයින් විසින් සොයා ගනු ලැබූ ආර්ථික විද්‍යාත්මක ඥාණසම්භාරය ප්‍රායෝගිකව භාවිතා කරනු ලබන අවස්ථාව න්‍යායාත්මකව ඉදිරිපත් වන මතවාදවලට වඩා වෙනස් මගක් ගනී. ඊට හේතුව න්‍යායාත්මකව කරුණු ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා උපකල්පන භාවිතා කිරීම නිසාය

අරපිරිමැස්ම පිළිබඳ විද්‍යාව ලෙස හැඳින්වෙන ආර්ථික විද්‍යාව අධ්‍යයනයේ දී එය සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව වශයෙන් වෙන්වෙන්ව අධ්‍යයනය කරයි. තොරතුරු ආර්ථික විද්‍යාව සූක්ෂම ආර්ථික විද්‍යාව යටතට ගැනෙයි. එක් එක් ප්‍රවේශ තුළින් ආර්ථික න්‍යායයන් ගොඩනැගීමේ දී ඒ ඒ න්‍යායයන්ට ආවේණික උපකල්පන විශාල ප්‍රමාණයක් පවතී. නමුත් කිසියම් ආර්ථික ක්‍රියාවලියකට සම්බන්ධ වන සියලුම දෙනා අතර කිසිදු වියදමක්, පරිශ්‍රමයක් හෝ කාල පමාවකින් තොරව තොරතුරු බෙදී ගොස් ඇතැයි යන උපකල්පනය ආර්ථික විද්‍යාවේ කුමන ප්‍රවේශයක දී වුවද නිබඳව යොදා ගනී. එහෙත් ප්‍රායෝගික තත්ත්වය පිළිබඳ විමසා බැලීමේදී එම උපකල්පනය කොතෙක් දුරට සාධාරණ ද යන්න පිළිබඳ සැකයක් මතුවීම නොවැළැක්විය හැකිය. මේ සම්බන්ධයෙන් තොරතුරු ගැටලුව ලෙස ආර්ථික විද්‍යාඥයින් හඳුනා ගන්නා මතවාදය පාඨකයාට හඳුන්වා දීම මෙම ලිපියේ අරමුණයි.

අර්ථ ක්‍රමයක ආර්ථික ක්‍රියාවන්හි නියුතු සියළුම පුද්ගලයින්ට, ආර්ථික තීන්දු තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියළුම තොරතුරු කිසිම කාල පමාවකින් තොරව වියදම් රහිතව ලබා ගැනීමට හැකියාවක් නොමැති බව, තොරතුරු ගැටලුව ලෙස ආර්ථික විද්‍යාඥයින් විසින් පෙන්වා දෙනු ලබයි. මෙලෙස හඳුන්වනු ලබන තොරතුරු ගැටලුව ප්‍රධාන කොටස් දෙකකින් යුතුව හඳුනා ගත හැකි ය. එනම්,

1. තොරතුරු අපූර්ණත්වය. (Imperfection Information)
2. තොරතුරු අසමමිතිකතාව (Information Asymmetry)

තීරණ ගැනීමට අවශ්‍ය කරන තොරතුරු සියල්ලම තීරකයන් සතුව නොමැති බව තොරතුරු අපූර්ණත්වය යන්නෙන් අදහස් කෙරේ. එනම්, තීරණ ගැනීමට ඉදිරිපත් වන කවර හෝ පාර්ශ්වයකට අවශ්‍ය ඇතැම් තොරතුරු නොමැති වීමයි. උදාහරණයක් ලෙස ඉදිරි මිලදී ගැනුම් ගිවිසුමකට එළඹීමට ඉදිරිපත් වන ගොවියෙකුට හෝ වෙළෙඳසැල් හිමියෙකුට හෝ කන්නය අවසාන වීමට පෙරාතුව අස්වැන්නේ මිලට කුමක් සිදුවිය හැකි ද යන්න පිළිබඳ පූර්ණ අවබෝධයක් නොමැත.

මෙම තත්ත්වය යටතේ ගනුදෙනුකරුවන්, විය හැකි ඕනෑම තත්ත්වයක් පිළිබඳ සලකා බලා තීන්දු ගත යුතු ය. එනම් ඒ ඒ වියහැකියා හා ඒ සඳහා ඇති සම්භාවිතා සලකා අපේක්ෂිත ප්‍රතිලාභය ප්‍රශස්ත කිරීමට පෙළඹේ. එහිදී ගනුදෙනුකරුවන්ගේ ස්වභාවය ද වැදගත් වනු ඇත. එනම් ගනුදෙනුකරුවා අවදානමට කැමති අයෙක් ද, අවදානම පිළිබඳව උපේක්ෂා සහගතව බලන අයෙක් ද, නොඑසේනම් අවදානම බැහැර කරන හෙවත් අවදානමට අකමැති අයෙක් ද යන්නයි.

තොරතුරු අසමමිතික බව පිළිබඳව සලකා බැලීමේ දී එය තොරතුරු අසම්පූර්ණ බව නිසා ජනිත කරන ප්‍රතිඵලවලට වඩා සංකීර්ණ ප්‍රතිඵල ජනිත කරයි. එනම් එහිදී තීන්දු ගැනීමේ ක්‍රියාවලිය අවිනිශ්චිත වනවාට අමතරව ගනුදෙනුකරුවන් අවිචාරශීලී තරඟයකට ප්‍රවිෂ්ඨ වීමක් ද දැකිය හැකිය.

සංවර්ධන ආර්ථික විද්‍යාව තුළ ආදායම් බෙදී යාමේ විෂමතාව පිළිබඳව විග්‍රහ කරන ආකාරයට ම තොරතුරු ආර්ථික විද්‍යාව තුළ තොරතුරු බෙදී යාමේ ගැටලුව තොරතුරු අසමමිතික බව යන්නෙන් නිශ්චිතව ම අදහස් කරනු ලබයි. මෙම අසමමිතික බෙදී යාම නිසා ගනුදෙනුවක නිරතවන්නන් අතර තොරතුරු සහිත පාර්ශ්වය හා තොරතුරු අහිමි පාර්ශ්වය යනුවෙන් දෙපිරිසක් හඳුනා ගත හැකි වේ. ඒ තත්ත්වය යටතේ තොරතුරු හිමි පාර්ශ්වයට, තොරතුරු අහිමි පාර්ශ්වය රැවටීමට අවකාශයක් ඇත. එහෙත් තොරතුරු හිමි පාර්ශ්වය, අහිමි පාර්ශ්වය අනිවාර්යයෙන් ම රවටන බවක් මෙ මගින් නොකියැවේ. එහෙත් අවංකවීම තාර්කික හැසිරීමක් නොවන බව ගම්‍ය වන අවස්ථා පවතී. එවැනි වංචනික හැසිරීම් හැඳින්වීමට ආර්ථික විද්‍යා සාහිත්‍යයේ විශේෂ පාරිභාෂික වචනයක් ලෙස සදාචාර හානි (Moral Hazards) යන වචනය භාවිත වේ. මෙහිදී සදාචාර හානිය ලෙස අදහස් වන්නේ තොරතුරු සහිත පාර්ශ්වය, තොරතුරු අහිමි වූවන්ට වංචා කිරීම සඳහා යොදා ගන්නා ඕනෑම උපක්‍රමයක් ය. එනිසා තොරතුරු අහිමි පාර්ශ්වය, තොරතුරු

හිමි පාර්ශ්වය විශ්වාස නොකිරීමට පෙළඹේ. මේ අන්දමින් රැවටීම හා සැක කිරීම් මත සිදුවන ආර්ථික ගනුදෙනුව කවර ආකාරයකින්වත් ප්‍රශස්ත සමතුලිතයක් ජනිත නොකරනු ඇත.

තොරතුරු අපූර්ණ බව හා තොරතුරු අසමමිතික බව යන්න පැහැදිලි ලෙස හඳුනා ගැනීම සඳහා සරල උදාහරණයක් ලෙස අලුත් මෝටර් රථයක් මිලදී ගැනීමක් හා පාවිච්චි කළ මෝටර් රථයක් මිලදී ගැනීමක් සලකා බලමු. තමන් මිලදී ගන්නා මෝටර් රථයේ ගුණාත්මක බව පිළිබඳ පූර්ණ විශ්වාසයක් මේ අවස්ථා දෙකේ දී ම මිලදී ගන්නා පාරිභෝගිකයා සතුව නැත. මෝටර් රථය අලුත් එකක් නම් තමන් අලෙවි කරන මෝටර් රථයේ ගුණාත්මක බව පිළිබඳ අලෙවි කරන්නා ද නිශ්චිතව නොදනී. වරක් පාවිච්චි කළ මෝටර් රථයක් සම්බන්ධ තත්ත්වය මීට වඩා වෙනස් වේ. එහි දී ගැනුම්කරුගේ තත්ත්වය මුල් සිද්ධියට වඩා වෙනස් නොවේ. එහෙත් මෝටර් රථය කලින් පාවිච්චි කළ පුද්ගලයා හෙවත් අලෙවිකරු සතුව මෝටර් රථයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳව වැඩි තොරතුරු පවතී. එසේ අලෙවිකරු ළඟ තොරතුරු නැති වුවද අඩුම තරමින් එසේ තොරතුරු පවතිනවා යැයි ගැනුම්කරු විශ්වාස කරයි.

තොරතුරු අසමමිතික වීමේ දී මතුවන ගැටලුව වන්නේ විකුණුම්කරු තම භාණ්ඩය පිළිබඳ පවසන දේ පිළිගැනීමට ගැණුම්කරු සූදානම් නොවීමයි. උදාහරණයක් වශයෙන් අප කවර හෝ දිගුකාලීන භාණ්ඩයක් ද්විතියික වෙළෙඳපොළින් මිලදී ගන්නා අවස්ථාවක විකුණුම්කරු එම භාණ්ඩයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ පවසන කරුණු සියල්ලම ඒ ආකාරයෙන්ම පිළිගැනීමට අප සූදානම් වන්නේ නැත. මේ තත්ත්වය තුළ අලෙවිකරුට සත්‍යය පැවසීමේ අවශ්‍යතාවක් පැන නොනඟී. තවත් උදාහරණයක් ලෙස යම් හානියක් වෙනුවෙන් රක්ෂණ වන්දි අයදුම් කිරීමේදී සත්‍ය හානියම ප්‍රකාශ කළහොත් රක්ෂණ සමාගම ඉල්ලා සිටි වන්දියෙන් කොටසක් කපා හැරීමට ඉඩ ඇති නිසා සත්‍ය හානියට වැඩි යමක් ඉල්ලා සිටීමට තාර්කික රක්ෂිතයා පෙළඹේ. ඒ අනුව අවංක වීම රක්ෂිතයාට අවාසි සහගත වනු ඇත. එමෙන්ම මේ පිළිබඳව රක්ෂණ සමාගමකින් විමසා සිටියහොත් ඔවුන් පවසනු ඇත්තේ රක්ෂිතයා ඉල්ලූ වන්දියට වඩා අඩු දීමනාවක් දීමට ඔවුන් පෙළඹෙන්නේ රක්ෂිතයන් තම හානිය අධි-තක්සේරු කිරීමට පෙළඹෙන නිසා බවයි. එනම් ඇතැම් රක්ෂිතයන්, වංචනිකයන් නිසා සහ වංචනික රක්ෂිතයන් කවුරුන්දැයි හඳුනා ගත නොහැකි නිසා සැමටම දඩුවම් කිරීමට රක්ෂණ සමාගම් පෙළඹී සිටී. තමන් වරදක් නොකළත් දඬුවම් ලැබෙන නිසා අවංක රක්ෂිතයන් ද වංචා කිරීමට එම දණ්ඩනයම පොළඹවන බව මෙම උදාහරණයෙන් පැහැදිලි වේ.

ආර්ථික විද්‍යාත්මකව සලකා බැලීමේ දී වංචනික බව හෙවත් සදාචාර හානිය තොරතුරු අසමමිතික තත්ත්වයක දී සමතුලිත හැසිරීම හෙවත් ප්‍රශස්ත හැසිරීම වන බව පැහැදිලි වේ.

එසේ නම් වංචනික බව සමාජයෙන් දුරු කළ හැකි වන්නේ තොරතුරු සමමිතිකව බෙදා හැරිය හැක්කේ නම් පමණි. තවදුරටත් මේ උදාහරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ඇතිවිය හැකි ගැටලු පිළිබඳව පැහැදිලි වේ. එනම් තරගයේ දී තොරතුරු අහිමි පාර්ශ්වය තමන්ට සිදුවිය හැකි අගතීන්ගෙන් මිදීමට විවිධ උපක්‍රම යොදා ගනී. ඉහත උදාහරණයෙන් දැක් වූ පරිදි තොරතුරු හිමි පාර්ශ්වය ඉදිරිපත් කරන අදහස් සංශෝධනය කර අර්ථ දැක්වීම ඉන් එක් උපක්‍රමයකි. නීතිමය ගිවිසුම් කරා එළඹීම, තෝරා බලා හඳුනාගත් අය සමග පමණක් ගනුදෙනු කිරීම ආදිය ඒ අතර ජනප්‍රිය උපක්‍රම වේ. මෙම කවර උපක්‍රමයක් හමුවේ වුවද සිදුවිය හැකි සිදුවීම් තුනක් හඳුනා ගත යුතුව ඇත. එනම් මේ නිසා පාර්ශ්ව දෙකේම පිරිවැය වැඩි වේ. ගනුදෙනුව සක්‍රීය කිරීම සඳහා දෙපාර්ශ්වයට ම දැරීමට සිදුවන මෙම පිරිවැය ගනුදෙනු පිරිවැය ලෙස නම් කරන අතර ආර්ථික විද්‍යාවේ බොහෝ න්‍යායන් මෙම ගනුදෙනු පිරිවැය ශූන්‍යය යන පිළිගැනීම යටතේ ව්‍යුත්පන්න කර ඇත.

කෙසේ වුවද තොරතුරු අසමමිතිකතාව පිළිබඳ ආර්ථික විද්‍යාඥයින් විසින් කරන න්‍යායාත්මක විග්‍රහය සලකා බැලීම මෙහිදී වැදගත් වනු ඇත. ප්‍රධාන ප්‍රවේශ තුනක් ඔස්සේ න්‍යායාත්මක පසුබිම සංවිධානය කළ හැකි ය. එනම්,

(අ) තොරතුරු ගැටලුවේ ආර්ථික පිරිවැය (අකලොෆ් ගේ ආකෘතිය) (Akerlof’s Model)

(ආ) තොරතුරු අහිමි පාර්ශ්වය තම ප්‍රතිමල්ලවයා පිළිබඳ අනුමාන කර නිගමනවලට එළඹීම. (ස්පෙන්ස් ගේ සංඥා ආකෘතිය) (Spence’s Signaling Model)

(ඇ) තොරතුරු හිමි පාර්ශ්වය අවංක ගනුදෙනුවකට පොළඹවා ගැනීම. (ප්‍රමුඛ - අනුගාමික ගැටලුව)

**අකලොෆ් ගේ ආකෘතිය**

මෙම ආකෘතිය අකලොෆ් ඉදිරිපත් කරන්නේ තොරතුරු අසමමිතිකතාව නිසා වෙළෙඳපොළ බිඳවැටෙන ආකාරය පැහැදිලි කිරීමටයි. මේ සඳහා අකලොෆ් පාවිච්චි කළ මෝටර් රථ සඳහා පවතින වෙළෙඳපොළ පිළිබඳ උදාහරණයක් ගෙන හැර දක්වයි.

පාවිච්චි කළ මෝටර් රථ සඳහා පවතින වෙළෙඳපොලේ තොරතුරු අසමමිතිකතා ගැටලු දක්නට ලැබේ. මෙහිදී මෝටර් රථය අලෙවි කරන පුද්ගලයා තම වාහනය පිළිබඳ නව ගැනුම්කරුට වඩා දනී. එමෙන්ම පැරණි හිමිකරුට තම වාහනයේ යථා තත්ත්වය නව ගැනුම්කරුට පැවසීමේ ප්‍රතිලාභයක් ද නැත. එමපණක් නොව පැරණි අයිතිකරු පවසන දේ භාර ගැනීමට ද නව ගැනුම්කරු සූදානම් නැත.

මේ තත්ත්වය තුළ වෙළෙඳපොළක් පවතී නම් එය සිදු වන්නේ අනුමාන මත පමණි. ගැනුම්කරුට තමන් මිලදී ගැනීමට සූදානම් වන භාණ්ඩයේ සැබෑ තත්වය දැනගත නොහැකි නිසා කළ හැකි එකම දෙය වන්නේ වෙළඳපොලේ අලෙවි වන මෝටර් රථයක සාමාන්‍ය තත්ත්වය තමන් මිලදී ගැනීමට සලකා බලන මෝටර් රථයේ ද ඇත යන පිළිගැනීම යටතේ ඊට අදාළ මිලක් ගෙවීමට ඉදිරිපත් වීමයි. මෙහිදී පහසුව සඳහා රථයේ මිල එහි තත්ත්වයට සමාන බව ද උපකල්පනය කරයි. එනම් $p=q$ බව වේ. ඒ අනුව වෙළෙඳපොළේ අලෙවි වන මෝටර් රථයක සාමාන්‍ය තත්ත්වය $\bar{q}$ නම් එම වෙළෙඳපොළේ අලෙවියට ඉදිරිපත් කොට ඇති කිසිදු මෝටර් රථයකට ඊට ඉහළ මිලක් අපේක්ෂා කළ නොහැකි

ය. මේ අනුව රථයේ  සත්‍ය තත්ත්වය කුමක් වුවත් දෙවන වෙළෙඳපොළට ඉදිරිපත් කළ වහාම එයට ලැබෙන මිල වන්නේ $\bar{q}$ වේ. නමුත් විකුණුම්කරුවන් තම වාහනයේ සත්‍ය තත්ත්වය දන්නා නිසා  ඔවුන්ගේ ප්‍රතිචාරය වන්නේ සාමාන්‍ය තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයේ වාහන දෙවන වෙළෙඳපොළේ අලෙවියට ඉදිරිපත් නොකිරීමයි.

මේ නිගමනයට අනුව සාමාන්‍ය තත්ත්වයකට වඩා ඉහළ මට්ටමේ වාහන කිසිවක් අලෙවි කිරීමට දෙවන වෙළෙඳපලට ඉදිරිපත් නොකෙරේ. (මෙහිදී මුදල් හදිසියක දී හෝ වෙනත් හදිසි අවශ්‍යතාවයක දී හෝ  මෙය සිදුවිය හැකි වුවත් අකලොෆ් ගේ ආකෘතිය ඒ පිළිබඳව නොසලකා හැර ඇත.) ඒ අනුව තම රථය අලෙවියට ඉදිරිපත් කළ පසුව එහි ඉහළ තත්ත්වය වර්ණනා කර ඉහළ මිලක් ඉල්ලා සිටීම හුදෙක්ම නිෂ්ඵල කටයුත්තකි.

මේ තත්ත්වය යටතේ දෙවන වෙළෙඳපොළට ඉදිරිපත් කෙරෙන වාහනයක උපරිම තත්ත්වය $\bar{q}$ වන නිසා එම වෙළෙඳපලට ඉදිරිපත් කෙරෙන වාහනයක සාමාන්‍ය තත්ත්වය ½ $\bar{q}$ වේ. මේ අනුව  ගැනුම්කරුවන් දෙවන වෙළෙඳපොළේ අලෙවියට ඇති වාහනයක් සඳහා ගෙවීමට කැමැති වන්නේ ½ $\bar{q}$ මිලයි. මේ පිළිබඳව අවධානය යොමු කරන  වාහන හිමිකරුවෝ ½ $\bar{q}$ ට ඉහළ තත්ත්වයේ වාහනයක් අලෙවියට ඉදිරිපත් නොකරති. මේ ආකාරයෙන් වෙළෙඳපොළ දිගින් දිගටම සංකෝචනය වී අවසානයේ දෙවන වෙළෙඳපොළට කිසිදු වාහනයක් ඉදිරිපත් නොවන බව අකලොෆ් ගේ අවසාන නිගමනය වේ.

මෙම ආකෘතියට අනුව න්‍යායාත්මකව තොරතුරු අසමමිතිකතාව හමුවේ දෙවන වෙළෙඳපොළක් ඇතිවිය   නොහැක. නමුත් ප්‍රායෝගිකව සලකා බැලීමේ දී ලෝකයේ දෙවන වෙළෙඳපොළක් පවතී. ඇතැම් විටෙක එය නව භාණ්ඩ වෙළෙඳපොළටත් වඩා පුළුල් වේ.

න්‍යායාත්මක නිගමනය හා ප්‍රායෝගික  නිරීක්ෂණ අතර වෙනසට හේතු කිහිපයක් හඳුනාගත හැකි ය. එනම්,

1. හදිසි අවශ්‍යතා මත සිදු කෙරෙන ගනුදෙනු

2. ඉහළ ගනුදෙනු පිරිවැයක් මත කෙරෙන ගනුදෙනු

මෙම තත්ත්ව දෙක යටතේ ගනුදෙනුවක් සිදුවන ආකාරය මීළඟ ආකෘති දෙක මගින් ඉදිරිපත් කෙරේ.

**සංඥා ආකෘතිය (මයිකල් ස්පෙන්ස්)**

තොරතුරු අසමමිතික තත්ත්වයක් තුළ වෙළෙඳපොළක් පැවැතිය නොහැකි බව අකලොෆ් ගේ ආකෘතිය මගින් පෙන්වා දෙයි. එසේ නම් සැබෑ ලෝකයේ මෙබඳු වෙළෙඳපොළවල් පවතින්නේ කෙසේද යන්න පිළිබඳ ස්පෙන්ස් ගේ සංඥා ආකෘතිය මගින් එක් ආකාරයක පිළිතුරක් සපයයි.

ස්පෙන්ස්ට අනුව තොරතුරු අහිමි පාර්ශ්වය තම ගනුදෙනුකරු පිළිබඳ අනුමාන කිරීමෙන් පසු ගනුදෙනු සඳහා ඉදිරිපත් වෙයි. ශ්‍රමයේ ඵලදායිතාව අනුමාන කිරීමට අධ්‍යාපනය යොදා ගැනීම මේ අතර ජනප්‍රිය උදාහරණයක් වේ. මෙබඳු අනුමාන සිදු කරනු ලබන්නේ කවර පදනමකින් ද? එසේ යොදාගත් අනුමාන දිගින් දිගටම විශ්වාසයක් ලෙස පවතින්නේ මක් නිසා ද? මෙම විශ්වාස වරින්වර වෙනස් වන්නේ මක් නිසා ද සහ මෙබඳු අනුමාන නිවැරදිවම සැඟවුනු තොරතුරු හෙළිදරව් කරන්නේ කවර තත්ත්ව යටතේ ද ? යන ප්‍රශ්නවලට පිළිතුරු ස්පෙන්ස් ගේ ආකෘතිය මගින් විමසා බැලේ.

ස්පෙන්ස් ගේ ආකෘතිය මගින් අධ්‍යාපනය ශ්‍රම වෙළෙඳපොළේ සංඥාවක් ලෙස ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කිරීමට උත්සාහ ගෙන ඇත. ඔහුගේ ආකෘතිය සඳහා උපකල්පන කිහිපයක් පදනම් කරගෙන තිබේ. ඒවා නම්,


1. ශ්‍රමයේ ඵලදායිතා මට්ටම් දෙකක් පමණක් පවතින බව. අඩු ඵලදායී හා වැඩි ඵලදායී යනු එම කාණ්ඩ දෙකයි. ඵලදායිතාව සේවා යෝජකයින්ට නිරීක්ෂණය කළ නොහැකි වන නමුත් ශ්‍රමිකයා එය දනී. ශ්‍රමයේ ඵලදායිතා මට්ටම් අධ්‍යාපනය මගින් හෙළිදරව් වන බව පිළිගැනීම.

2. ඵලදායීතාව ඉහළ ලෙස හඳුනාගත් අයට ඉහළ වැටුපක් ගෙවීමටත්, ඵලදායීතාව පහළ ලෙස හඳුනාගත් අයට අඩු වැටුපක් ගෙවීමටත් සේවා යෝජකයෝ සූදානම් ව සිටින බව.

3. ශ්‍රමයේ ඵලදායිතාව ද අධ්‍යාපන පිරිවැය කෙරෙහි බලපායි. වැඩි ඵලදායිතාවක් සහිත අයට කවර හෝ අධ්‍යාපන මට්ටමක් වාර්තා කිරීම සඳහා වැය වන්නේ ඵලදායීතාව අඩු අයට වඩා සාපේක්ෂව අඩු පිරිවැයක් බව.

පහත සඳහන් කොන්දේසි යටතේ  සංඥා ආකෘතියේ පසුබිම පහත සඳහන් රූප සටහන මගින් විස්තරාත්මකව අධ්‍යයනය කළ හැකි ය.

**ප්‍රස්ථාර අංක 1          අධ්‍යාපන සංඥා සමතුලිතය**




ඉහත ප්‍රස්තාරයේ සිරස් අක්ෂයෙන් පිරිවැය සහ වැටුප් ද, තිරස් අක්ෂයෙන් අධ්‍යාපන මට්ටම ද දක්වා ඇත. ඒ අනුව මෙහි අධ්‍යාපන මට්ටම් දෙකක් වෙළෙඳපොළ විසින් කඩඉම් ලෙස පිළිගෙන ඇත. ඒවා නම් $Q_1$ $Q_2$ අධ්‍යාපන මට්ටම් ය. අධ්‍යාපනය

මඟින් ඵලදායිතාව නිරූපනය වන බවට සේවා යෝජකයින් පිළිගන්නා නිසා $Q_1$ අධ්‍යාපන මට්ටම වාර්තා කළ අය සඳහා $W_0$ වැටුපක් ද, $Q_2$ මට්ටමේ අධ්‍යාපනයක් ලැබූ අයට $W_1$ වැටුපක් ද තීරණය වේ. $U_L$ හා $U_H$ යනු අඩු ඵලදායී හා වැඩි ඵලදායී පුද්ගල කණ්ඩායම් සඳහා වන අධ්‍යාපන පිරිවැය වක්‍ර වේ. පිරිවැය රේඛා වමේ සිට දකුණට ඉහළ නගිමින් ධන බෑවුමක් සහිත වීම තුළින් අදහස් වන්නේ ඉහළ සංඥා සඳහා පිරිවැය වැඩි වන බවයි. අඩු ඵලදායී අයගේ පිරිවැය රේඛාව වැඩි ඵලදායී අයගේ රේඛාවට ඉහළින් පිහිටා තිබීමෙන් අදහස් වන්නේ ඕනෑම සංඥාවක් සඳහා සාපේක්ෂව ඉහළ පිරිවැයක් දැරීමට අඩු ඵලදායී අයට සිදුවන බවයි. මෙම ආකෘතියේ සමතුලිතතාව පිළිබඳ අධ්‍යයනයේ දී පහත කරුණු වැදගත් වනු ඇත.

(අ) මෙම ආකෘතියට අනුව අධ්‍යාපන කඩඉම් දෙකක් පමණක් පවතී. ඒවා නම් $Q_1$ හා $Q_2$ නමැති අධ්‍යාපන මට්ටම් ය. වැටුප් තීන්දු වන ආකාරය අනුව කිසිදු පුද්ගලයෙක් කඩඉම් අතර අධ්‍යාපනයක් ලබා නොනවතිනු ඇත. කොටසක් $Q_1$ හි නවතින අතර සෙසු අය $Q_2$ දක්වා ගමන් කරනු ඇත. $Q_1$ හා $Q_2$ අතරමැද අධ්‍යාපනය හමාර කරන්නෙකු හෝ $Q_2$ මට්ටමට වඩා ඉහළ අධ්‍යාපන මට්ටමක් දක්වා ගමන් කරන්නෙකු මෙම ආකෘතියට අනුව අපේක්ෂා කළ නොහැක.

(ආ) යමෙක් අධ්‍යාපන මට්ටම තීරණය කරන්නේ එමගින් ලබාගත හැකි ශුද්ධ ප්‍රතිලාභයට අනුව ය. ශුද්ධ ප්‍රතිලාභය වන්නේ ඒ ඒ අධ්‍යාපන මට්ටම යටතේ ලැබෙන වැටුප හා ඒ ඒ අධ්‍යාපන මට්ටම ලබා ගැනීම සඳහා දැරීමට සිදු වූ වියදම අතර වෙනස යි. ඒ අනුව ශුද්ධ ප්‍රතිලාභය උපරිම වන අධ්‍යාපන සංඥාව නිකුත් කරනු ඇත.

(ඇ) කඩඉම් අතර අසමත්වීම් හෝ වෙනත් ආකාරයක හේතූන් මත අධ්‍යාපනයෙන් බැහැරවීම්වලට හෝ අවකාශයක් නැත. මින් අදහස් වන්නේ එක් කඩඉමකින් තවත් කඩඉමකට මාරු වීමේ දී කිසිදු අවිනිශ්චිතතාවක් ඇති නොවන බවයි.

මේ තත්ත්වය තුළ අධ්‍යාපනය $Q_1$ ලෙස වාර්තා කළහොත් ඒ සඳහා වන පිරිවැය ද ශූන්‍යය (0) වන නිසා ශුද්ධ ප්‍රතිලාභය වන්නේ ඊට අදාළ වැටුප යි. එනම් $W_0$ වේ. අධ්‍යාපන මට්ටම $Q_2$ නම් තත්ත්වය මීට වඩා වෙනස් වේ. ඒ යටතේ අඩු ඵලදායිතා පාර්ශ්වයේ ශුද්ධ ප්‍රතිලාභය වන්නේ $Q_1 W_1 - Q_2B$ ය. ප්‍රස්තාරය නිර්මාණය කොට ඇති ආකාරය අනුව මේ අවස්ථාවේ ශුද්ධ ප්‍රතිලාභය BC පරතරයට සමාන වේ.

වැඩි ඵලදායී පාර්ශ්වයේ ශුද්ධ ප්‍රතිලාභය ලෙස $Q_1 W_1 - Q_2A$ දැක්විය හැකි ය. මෙම ප්‍රස්තාරයේ AC පරතරයට සමාන වේ. මේ තත්ත්වය යටතේ සියළුම වියහැකියාවන් පහත පරිදි වේ.

- $Q_1 W_0$ පරතරය BC පරතරයට වඩා විශාල නම් අඩු හැකියා සහිත පාර්ශ්වය $Q_1$ නවතිනු ඇත. ඔවුන් $Q_2$ සංඥාවට යන්නේ BC පරතරය $Q_1 W_0$ පරතරයට වඩා වැඩි වුවහොත් පමණි.

- $Q_1 W_0$ පරතරය AC පරතරයට වඩා විශාල නම් වැඩි හැකියා සහිත පාර්ශ්වය $Q_1$ නවතිනු ඇත. ඔවුන් $Q_2$ සංඥාවට යන්නේ AC පරතරය $Q_1 W_0$ පරතරයට වඩා වැඩි වුවහොත් පමණි.

මේ කාරණා අනුව පැවැතිය හැකි සමතුලිතතා ප්‍රභේද තුනක් පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරේ.

1. වෙන්වීමේ සමතුලිතය. (Separating Equilibrium)

2. එක්වීමේ සමතුලිතය (Pooling Equilibrium)

3. මිශ්‍ර සමතුලිතය (Hybrid Equilibrium)

**වෙන්වීමේ සමතුලිතය**

මේ යටතේ පාර්ශ්ව දෙක සංඥා අතර ස්වේච්ඡාවෙන්ම බෙදී යනු ඇත. එනම්, අඩු ඵලදායී අය $Q_1$ හා වැඩි ඵලදායී අය $Q_2$ සංඥා වාර්තා කරයි. මෙය සිදුවීම සඳහා කොන්දේසි දෙකක් ඉටුවිය යුතු ය. එහි පළමුවැන්න නම් $Q_1 W_0$ පරතරය BC පරතරයට වඩා විශාල වීම වන අතර අනෙක වන්නේ AC පරතරය $Q_1 W_0$ පරතරයට වඩා වැඩි වීමයි. මෙම කොන්දේසි දෙකම ඉටුවුවහොත් ඉහළ අධ්‍යාපන මට්ටම් වාර්තා කරන අය වැඩි ඵලදායී ලෙස සේවායෝජකයන්ට භාරගත හැකි වන අතර, ඔවුන්ගේ විශ්වාසය දිගු කාලයේ දී තහවුරු වනු ඇත.

**එක්වීමේ සමතුලිතය**

මේ සමතුලිතයට අනුව පාර්ශ්ව දෙකම එක් සංඥාවකට සීමා වේ. එක්කෝ දෙපාර්ශ්වයම $Q_1$ සංඥාව නිකුත් කරයි. නොඑසේ නම් $Q_2$ සංඥාව නිකුත් කරයි. $Q_1 W_0$ පරතරය AC පරතරයට වඩා විශාල වුවහොත් දෙපාර්ශ්වයම $Q_1$ සංඥාව නිකුත් කරන අතර, $Q_1 W_0$ ට වඩා BC විශාල වුවහොත් $Q_2$ සංඥාව නිකුත් කරනු ඇත. එසේ වුවහොත් අධ්‍යාපනයට සංඥාවක් ලෙස දිගුකාලීන පැවැත්මක් නොපවතිනු ඇත.

**මිශ්‍ර සමතුලිතය**

මෙහිදී ඇති වන්නේ $BC = Q_1 W_0$ වූ විට ය. එවිට AC අනිවාර්යයෙන් ම $Q_1 W_0$ ට වඩා විශාල වන නිසා ඵලදායීතාව ඉහළ පාර්ශ්වය $Q_2$ සංඥාව නිකුත් කරන අතර ඵලදායීතාව පහළ පාර්ශ්වය අහඹු ලෙස හැසිරේ. අඩු ඵලදායී පාර්ශ්වයේ පිරිසක් $Q_1$ වාර්තා කරන අතර සෙසු පිරිස $Q_2$ වාර්තා කරනු ඇත. මෙහිදී සංඥාව සඵල වන්නේ එක් පක්ෂයකට පමණි. එනම් $Q_1$ සංඥාව නිකුත් වූයේ නම් ඒ නියත වශයෙන් ම අඩු ඵලදායී කණ්ඩායමෙන් වන අතර, $Q_2$ සංඥාව නිකුත් කරන්නන් පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹිය නොහැක. ඒ අනුව මිශ්‍ර සමතුලිතය යටතේ ද සංඥාව සඵල සංඥාවක් විය නොහැකි ය.

මේ ආකාර වූ සංඥා විග්‍රහය තුළින් තොරතුරු සමතුලිතය පිළිබඳව වැදගත් නිගමන කිහිපයකට එළඹී ඇත. එනම්,

(අ) තොරතුරු අසමමිතිකතාව හමුවේ තොරතුරු අහිමි පාර්ශ්වය පුද්ගලයන්ගේ අදෘශ්‍ය ලක්ෂණ අනුමාන කිරීම සඳහා දෘශ්‍ය ලක්ෂණ භාවිතා කරයි.

(ආ) මෙම භාවිතය කිසිදු විද්‍යාත්මක හෝ තාර්කික හෝ කරුණු රැස් කිරීමක් මත පදනම් වීම අනිවාර්ය නොවේ.

(ඇ) එබඳු විශ්වාසයන් දිගින් දිගටම සමාජයේ පැවැත්මට අවශ්‍ය කරන කොන්දේසිය වන්නේ විශ්වාසය මත ගත් තීන්දුව අත්දැකීම් මත තහවුරු වීමයි. එසේ නොවුනහොත් වෙනත් සංඥාවක් කරා එළැඹීමට සමාජය පෙළඹේ.

(ඈ) මේ අන්දමින් ප්‍රතිෂ්ඨාපනය වන සංඥාව සඵල සංඥාවක් ලෙස හඳුනා ගත හැක.

(ඉ) යම් සංඥාවක් සඵල සංඥාවක් වීම සඳහා අවශ්‍ය වන අවම කොන්දේසි කිහිපයක් පවතී. එනම්,

● සංඥාව සඳහා පිරිවැයක් පැවතීම හා වඩාත් ඉහළ සංඥාවක් නිකුත් කිරීමේ පිරිවැය අඩු සංඥාවක් නිකුත් කිරීමේ පිරිවැයට වඩා වැඩි වීම.

● එම පිරිවැය හා හෙළිදරව් කර ගැනීමට අපේක්ෂා කරන ලක්ෂණය අතර සෘණ සම්බන්ධතාවයක් පැවතීම. ඉහත දුන් උදාහරණයට අනුව වැඩි ඵලදායී අයගේ සංඥා නිකුත් කිරීමේ පිරිවැය අඩු ඵලදායී අයගේ පිරිවැයට වඩා අඩු ය.

**ප්‍රමුඛ අනුගාමික ගැටලුව**

තොරතුරු හිමි පාර්ශ්වය අවංක හැසිරීමකට පොළඹවා ගැනීමේ උපක්‍රම පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරේ. මෙහි ප්‍රමුඛයා යනු සේවා යෝජකයා වන අතර, එය තොරතුරු අහිමි පාර්ශ්වය ද වේ. අනුගාමිකයා යනු සේවකයා වේ. සේවකයාට කිසියම් කාර්යයක් පැවරූ විට ඔහු එය කෙතරම් අවංකව ඉටු කරයි ද යන්න සේව්‍යයාට නිරීක්ෂණය කළ නොහැකි වීම මෙහිලා සාකච්ඡා වන තොරතුරු අසමමිතිකතා ගැටලුවයි. එබඳු තත්ත්වයක් තුළ අවංකව කටයුතු කිරීමට සේවකයා පොළඹවා ගැනීම සඳහා භාවිතා කළ යුතු ගෙවීම් ක්‍රම පිළිබඳව මෙම ආකෘතියේ සාකච්ඡා වේ. තවත් අයුරකින් පවසන්නේ නම් මෙම ආකෘතිය සලකා බලන්නේ සදාචාර හානිය අවම කර ගැනීමේ උපක්‍රම පිළිබඳවයි.

මෙම ආකෘතිය පදනම්ව ඇති උපකල්පනවලට අනුව සේව්‍යයා ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරන අතර, තමන්ගේ ලාභය තහවුරු කර ගැනීමට නම් සේවකයාගේ දායකත්වය අත්‍යවශ්‍ය වේ. සේව්‍යයාගේ අරමුණු හා සේවකයාගේ අරමුණු අතර ගැටීමක් පවතී. එනම් සේව්‍යයා තම ලාභය උපරිම කර ගැනීම අරමුණු කරගෙන හැසිරෙන අතර, සේවකයා හැසිරෙන්නේ තම තෘප්තිය උපරිම කිරීම පදනම් කරගෙන ය. සේවකයාගේ උපයෝගිතාව තීන්දු වන්නේ ආදායම හා විවේකය මතයි. ඒ නිසා සේව්‍යයා ගෙවීමට එකඟ වන වැටුපට සේවකයා ද එකඟ නම් ඔහුට කළ හැකි හොඳම දේ වන්නේ රැකියාව පිළිගෙන අඩුවෙන් සේවය කර තම උපයෝගීතාව උපරිම කර ගැනීමයි. එසේ කිරීම නිසා සේව්‍යයාගේ අරමුණ ඉටු නොවේ. කවර හෝ ඉහළ වැටුපක් මෙම තත්ත්වය වෙනස් කිරීමට හේතු නොවන බව ද වටහා ගත යුතු ය.

මේ තත්ත්වය තුළ ප්‍රමුඛ-අනුගාමික ආකෘතිය විකල්ප ගෙවීම් ක්‍රම යෝජනා කරයි. ඒ අනුව ගෙවීම කොටස් දෙකකින් යුක්තය. පළමුවැන්න සහභාගිතා සංරෝධකය ලෙස නම් කෙරේ. ඊට අනුව සේවකයාට කරන ගෙවීම තමන් සමඟ එක්ව වැඩ කිරීමට පෙළඹෙන සුළු ගෙවීමක් විය යුතු ය. මේ සඳහා සේවකයාගේ ආවස්ථික පිරිවැය හා ඔහුට දැරීමට සිදුවන සෘජු පිරිවැයක් තිබේ නම් එය ද ගෙවීම ප්‍රමාණවත් වේ.

මෙම ගෙවීම සේවකයා අවංකව කටයුතු කිරීමට පොළඹවා ගැනීමට ප්‍රමාණවත් නොවේ. ඒ නිසා සානුබල සංරෝධකයක් ලෙස දෙවන උපක්‍රමයක් ද යොදාගත හැකි ය. එය දණ්ඩනයක් ලෙස ද යොදාගත හැකි ය. එනම්, අපේක්ෂිත නිමැවුම ලබා දීමට අපොහොසත් වුවහොත් එකඟ වූ වැටුපට අඩු ගෙවීමක් කිරීමට එකඟ වීමයි. එහිදී සහභාගිතා සංරෝධකය සේවකයාගේ ආවස්ථික පිරිවැය සඳහා ප්‍රමාණවත් වන නිසා රැකියාව ප්‍රතික්ෂේප කිරීමට සේවකයා නොපෙළඹේ. රැකියාව භාරගත් පසු අවංකව කටයුතු කර තම ආවස්ථික පිරිවැය ආරක්ෂා කර ගැනීමට සේවකයා බැඳේ. මෙවැනි ගෙවීම් ක්‍රම ප්‍රායෝගික ලෝකයේ ද විරල නොවේ. කෑලි ක්‍රමයට ගෙවීම මේ අතර ඉතාමත් ප්‍රචලිත ක්‍රමයකි. සේවකයා ශේෂ ප්‍රතිලාභ ලබන්නෙකු බවට පත් කිරීම තවත් උපක්‍රමයකි. ඒ යටතේ සේව්‍යයා තම ලාභයට සරිලන ප්‍රමාණයක් තක්සේරු කොට ව්‍යාපාර කටයුත්ත සේවකයාට විකුණයි. එහි මිල වන්නේ තමන්ගේ ලාභයයි. එවිට සේවකයාට සිදුවන්නේ ඉතා වෙහෙස වී වැඩ කර තම පංගුව ආරක්ෂා කර ගැනීමයි. වර්තමානයේ බෙහෙවින් භාවිතා වන උප කොන්ත්‍රාත් ක්‍රමය මේ සඳහා කදිම උදාහරණයකි.

කෙසේ නමුත් මෙම ක්‍රමය සාර්ථක වන්නේ එක් සුවිශේෂී උපකල්පනයක් මත ය. එනම්, නිෂ්පාදන ක්‍රියාවලිය කිසිදු ආකාරයක අවිනිශ්චිතතාවකට යටත් නොවන බවයි. එසේ නම් අවිනිශ්චිත බව යටතේ කුමක් සිදුවිය හැකි දැයි විමසා බැලිය යුතු ය.

පූර්ණ නිශ්චිත තත්ත්වයක් තුළ සේවකයාගේ කැපවීම පිළිබඳ නිවැරදි තක්සේරුවක් අවසාන නිෂ්පාදනය නිරීක්ෂණය කිරීමෙන් ලබාගත හැකි ය. නිෂ්පාදනය අපේක්ෂිත ඉලක්ක සපුරා නැතිනම් එය සම්පූර්ණයෙන්ම සේවකයාගේ වගකීමක් බවට පත් වේ. ඒ නිසා යෝජිත දණ්ඩන ක්‍රමය පිළිගත හැකි විසඳුමක් වනු ඇත.

නිෂ්පාදනයේ අවිනිශ්චිත බව හඳුන්වා දීමත් සමඟ නිමැවුම් ඉලක්ක සැපයීම තීන්දු කරන සාධක දෙකක් ඇති වේ. ඉන් එකක් සේවක කැපවීම වන අතර, අනෙක විවිධාකාර අවිනිශ්චිතතා වේ. අවිනිශ්චිත හේතුවක් මත නිෂ්පාදනය අඩු වූ විට ඊට වන්දි ගෙවීමට සිදු වන්නේ සේවකයාට ය. මේ තත්ත්වය තුළ අවංක සේවකයන් සේවා සැපයීමට ඉදිරිපත්වීමට මැලි වේ. ඒ නිසා සේවයට ඉදිරිපත් වන්නේ වංක සේවකයන් පමණි. ඒ අනුව සේව්‍යයා හමුවේ ඇති ගැටලුව සදාචාර හානියක සිට අහිතකර තේරීමක් දක්වා වෙනස් වේ.

**තොරතුරු අසමමිතිකතාව හා රජයේ කාර්යභාරය**

තොරතුරු ගැටලුව හමුවේ රජයට විශේෂ කාර්යභාරයක් ද පැවරේ. තොරතුරු සම්පාදනයට අවශ්‍ය කටයුතු හා තොරතුරු අසමමිතිකතාව නිසා දුෂ්කරතාවලට පත්වන පාර්ශ්ව ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීති හා ආයතනික රටා ඇති කිරීම මෙම වගකීම් අතර ප්‍රමුඛ වේ.

ලෝකයේ විවිධ ප්‍රදේශවල ඇති ප්‍රජාතන්ත්‍රවාදී රටවල් ජනතාවට තොරතුරු සැපයීම සඳහා සෘජුව දායක වනවා පමණක් නොව ඒ සඳහා පෞද්ගලික අංශය ද පෙළඹවයි. විඥාපන තාක්ෂණය පිළිබඳ කෙරෙන ආයෝජන මගින් තොරතුරු සම්පාදනයට කෙරෙන දායකත්වය අතිමහත් ය.

(19 පිටුවට...)

# රාජ්‍ය ණය කළමනාකරණය සහ ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය ණය ප්‍රවණතා

**අයි.එච්.එම්.එස්. හේරත්**

නියෝජ්‍ය අධිකාරි, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව.


වර්තමානයේ බොහෝ රටවල් සංවර්ධන හා සුභසාධන කටයුතුවලට විශාල ලෙස යොමු වී ඇත. එ බැවින් එම රටවල රාජ්‍ය වියදම, රාජ්‍ය ආදායම ඉක්මවා යෑමෙන් අය-වැය හිඟයකට මුහුණ පා ඇත. එවැනි රටවල් අය-වැය හිඟය පියවා ගැනීමේ මාර්ගයක් ලෙස ණය ලබා ගනී. එහෙත් සෑම රටකම අය-වැය හිඟයක් දක්නට නො ලැබේ. දියුණු යැයි සම්මත සම්පත් බහුල ඉහළ ඒක පුද්ගල ආදායමක් සහිත රටවල වියදමට වඩා ඉහළ ආදායමක් රජයට ලැබෙන බැවින් එවැනි රටවල අය-වැය අතිරික්තයක් පවතී. ඇතැම් විට සම්පත් විශාල ප්‍රමාණයක් සහිත එහෙත් කුඩා ජනගහනයකින් යුත් රටවල (උදා: බෲනෙයි රාජ්‍ය) රාජ්‍ය ආදායම වියදම ඉක්මවා යයි. අනෙක් රටවල් අය-වැය හිඟය පියවා ගැනීම පිණිස ආදායම වැඩිකර ගැනීම හෝ වියදම් කපාහැරීම හෝ ණය ලබා ගැනීම හෝ කළ යුතු ය. බොහෝ විට සිදුවනුයේ මෙම මාර්ග සියල්ල ම යම් ප්‍රමාණයකට අනුගමනය කිරීමයි.

රජයක් විසින් අය-වැය හිඟය පියවීම සඳහා ණය ලබා ගන්නේ නම් එහි දී අවධානයට ලක් කළ යුතු කරුණු රාශියක් ඇත. වර්ෂයක් ඇතුළත රජයකට ලබාගත හැකි ණය ප්‍රමාණය පාර්ලිමේන්තුව විසින් අනුමත කරගනු ලබන විසර්ජන පනත මගින් තීරණය කරනු ලබයි. යම් හෙයකින් එය ප්‍රමාණවත් නොවුන හොත් පාර්ලිමේන්තුවට ගෙන එන විසර්ජන පනත් සංශෝධනයක් මගින් ණය සීමාව ඉහළ නැංවිය හැකිය. එසේ ම ණය ලබාගැනීම සම්බන්ධ අනෙකුත් අණපනත් ද බලපානු ලැබේ. ඊට අමරතව ණය ගැනීමේ දී අනෙකුත් සාර්ව ආර්ථික විචල්‍යයන් ද සැළකිල්ලට ලක්කරනු ලැබේ. මෙම ලිපියෙහි අරමුණ වනුයේ, රාජ්‍ය ණය කළමනාකරණය යනු කුමක් ද යන්න සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳව සැකෙවින් සාකච්ඡා කිරීම ය.

**රාජ්‍ය ණය කළමනාකරණය**

රාජ්‍ය ණය කළමනාකරණය යන සංකල්පය ක්‍රමාණුකූල ව වර්ධනය වූවකි. වර්තමානයේ දී රාජ්‍ය ණය කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ අවම පිරිවැයක් හා පිළිගත හැකි මට්ටමක අවදානමක් සහිතව (විචක්ෂණශීලී මට්ටමක අවදානමක් සහිතව) රාජ්‍ය අය-වැය හිඟය පියවීම සඳහා ණය ලබාගැනීම නිශ්චිතව සිදුකිරීමයි. ණය කළමනාකරණය සඳහා ණය ලබාගන්නා මාර්ග හෙවත් මූලාශ්‍ර, ණය උපකරණ, පිරිවැය, ණය පියවීම හා නැවත ලබාගැනීම, අවදානම තක්සේරු කිරීම, ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම ආදී කරුණු රාශියක් පිළිබඳව සැළකිල්ලට ලක්කරයි. ණය කළමනාකරණයෙහි ලා දක්වන ලද දුර්වලතා හේතුවෙන් 1982 ඇති වූ මෙක්සිකානු ණය අර්බුදය සහ වර්තමානයේ දී ග්‍රීසිය ප්‍රමුඛ ඇතැම් යුරෝපා රටවල මතුව ඇති අර්බුදයෙනුත් පෙන්වා දෙන්නේ මෙම විෂයෙහි ඇති වැදගත් කමයි. දුර්වල ණය කළමනාකරණය තුළින් ඇතිවන ගැටලු තනි රටකට පමණක් නොව ජාත්‍යන්තර වෙළෙඳාම හා ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා ලෝකයේ සියළුම රටවලට බලපායි. ණය කළමනාකරණයේ දුර්වලතා නිසා රටක් ආර්ථිකමය වශයෙන් බිඳවැටීමට සමගාමීව එම රටට ණය සපයා ඇති ආයතන පිහිටි අනෙකුත් රටවලට ද එ මෙන් ම අර්බුදයට ලක්වන රට සමඟ ජාත්‍යන්තර වෙළෙඳාමේ නියැලී සිටින අනෙකුත් රටවල කර්මාන්තවලට ද බලපෑමක් ඇති වේ. අවසානයේ දී එය ජාත්‍යන්තර අර්බුදයක් බවට පත්වේ. එබැවින්, ණය කළමනාකරණය වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් දැඩි සැළකිල්ලට ලක්ව ඇති මාතෘකාවකි.

බොහෝ රටවල් සංවර්ධන හා සුභසාධන කටයුතුවල විශාල ලෙස නියැලී සිටින හෙයින් ද කර්මාන්ත හා ව්‍යාපාර අයිතිය වැඩි වශයෙන් පෞද්ගලික අංශය සතුව පවතින හෙයින් ද බොහෝවිට රාජ්‍ය වියදම, රාජ්‍ය ආදායම ඉක්මවා සිටිනු නැතහොත් අය-වැය හිඟයක් තිබෙනු දක්නට ලැබේ. එම අය-වැය හිඟය පියවා ගැනීම හෙවත් අය-වැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ණය ලබාගන්නා ප්‍රධාන මාර්ග දෙකකි. එනම් දේශීය මූලාශ්‍රවලින් සහ විදේශීය මූලාශ්‍රවලින් ණය ලබාගැනීම යි. මෙම මූලාශ්‍ර දෙක යටතේ විවිධ මාර්ගවලින් ණය ලබාගත හැකි අතර ඒ එක් එක් මාර්ගයෙන් ණය ලබාගැනීමෙන් ඇති වන ආර්ථික ප්‍රතිවිපාක විවිධය. අය-වැය හිඟය මූල්‍යනය කිරීමේ මූලාශ්‍ර සහ ඒ ඒ මූලාශ්‍ර යටතේ ණය ලබාගත හැකි මාර්ග පහත දැක්වෙන සටහන ඇසුරින් විමසා බලමු.




## 1. දේශීය මූලාශ්‍රවලින් ණය ගැනීම්

### 1.1 ප්‍රසාරණාත්මක මූලාශ්‍ර

අය-වැය හිඟය පියවීම පිණිස යොදාගත හැකි පහසු හා සම්ප්‍රදායික ණය ලබාගන්නා මූලාශ්‍ර දෙකකි. ඒවා මහ බැංකුවෙන් කෙටිකාලීන ණය හෝ අත්තිකාරම් හෝ ලබාගැනීම සහ වාණිජ බැංකුවලින් ණය ලබාගැනීමයි. රජය මහ බැංකුවෙන් ණය ලබාගත හොත් (මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් අලෙවි කර මුදල් ලබා ගතහොත්) භාණ්ඩාගාර බිල්පත්වලට ගෙවීම සඳහා මහ බැංකුව අලුතින් මුදල් නිකුත් කළ යුතු වේ. එවිට එතෙක් රට තුළ සංසරණය වෙමින් පැවති මුදල් ප්‍රමාණයට අලුතින් මුදල් එකතු වීම නිසා රට තුළ මුදල් සැපයුම ඉහළ යයි. ඒ මගින් උද්ධමනාත්මක ප්‍රතිවිපාක උද්ගත වේ. ඒ හැරුණු විට, රට තුළ ඇති වාණිජ බැංකුවලින් ද රජයට ණය ලබාගත හැකි ය. වාණිජ බැංකු විසින් ණය දීමේ දී මුදල් මැවීමක් සිදු කරන බැවින් ඒ මගින් ද ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති වේ. එනිසා මේවා අවම ක්‍රියාමාර්ග (වෙනත් මාර්ගයක් නැතහොත් භාවිතා කරන) පිළියම් වේ.

### 1.2 ප්‍රසාරණාත්මක නොවන මූලාශ්‍ර

මහ බැංකුව හා වාණිජ බැංකු හැරුණු විට රට තුළ විවිධ ආයතනික ආයෝජන අරමුදල් (බැංකු නොවන) පවතී. උදාහරණයක් ලෙස රක්ෂණ අරමුදල්, ඉතිරිකිරීම් ආයතන (උදා: ලංකාවේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල ආදී විවිධ අරමුදල්) ආදියෙන් රජයට ණය ලබාගත හැකිය. මෙම ආයතන සතු අරමුදල් ප්‍රාග්ධන වෙළෙඳපොළේ විවිධ ආකාරයෙන් ආයෝජන කරයි. එම අරමුදල් රජයට ණය වශයෙන් ලබා ගත හැක. එවිට වෙළෙඳපොළේ එතෙක් සංසරණය වෙමින් පැවැති මුදල් රාජ්‍ය භාණ්ඩාගාරය වෙතත් එතුළින් නැවතත් රජයේ වියදම් ලෙස වෙළෙඳපොළටත් ගලා යයි. ඒ මගින් රට තුළ දැනට පවතින මුදල් තොගයේ කිසිදු වෙනසක් සිදු නොවේ. ඒ බැවින් එය ප්‍රසාරණාත්මක නොවන ණය ගැනීම් මූලාශ්‍රයක් ලෙස හඳුන්වයි.

ඉහත සාකච්ඡා කළ ආකාරයට රජයකට දේශීය වශයෙන් ණය ලබාගැනීමේ දී ප්‍රසාරණාත්මක නොවන ක්‍රම භාවිතා කිරීම හිතකර වුව ද එයට ද යම් සීමා සහ සංරෝධක බලපවත්වයි. රජය මෙලෙස ණය ලබාගැනීම නිසා වෙළෙඳපොළේ ණය අරමුදල්

සඳහා ඉල්ලුම ඉහළ යාමෙන් පොලී අනුපාතය කෙරෙහි පීඩනයක් ඇති වේ. පොලී අනුපාතය ඉහළ යාමෙන් ආයෝජකයින්ගේ (පොලී) පිරිවැය ඉහළ යෑම, භාණ්ඩවල මිල ඉහළ යෑම හරහා ලාභ අනුපාතික පහත වැටීම නිසා ආයෝජකයන් අධෛර්යමත් විය හැකිය. එ මගින් ජාතික නිෂ්පාදිතය අඩු වී ආර්ථික වර්ධන වේගය පහත වැටීම සිදුවිය හැකිය. එමෙන්ම මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළේ පවතින ආයතන පෞද්ගලික අංශයට වඩා රජයට ණය දීමට වැඩි කැමැත්තක් දක්වයි. එයට හේතුව, රජයට ණය දීම වඩා සුරක්ෂිත බැවිනි. එවිට, පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා ගලා යෑමට ඇති අරමුදල් රාජ්‍ය අංශයට ගලා යෑම නිසා තෙරපීමේ ප්‍රතිවිපාකයක් (Crowding Out Effect) ඇති වේ. එම නිසා, රජයක් අය-වැය හිඟය පියවීම සඳහා ණය ලබාගැනීමේ දී මෙන් ම රජයේ වියදම් සැලසුම් කිරීමේ දී ද මේ පිළිබඳ ව විචක්ෂණශීලීව අවධානය යොමු කළ යුතු වේ. මේ නිසා නූතන රාජ්‍ය මූල්‍ය සැළසුම්වලදී අය-වැය පරතරය අඩු කිරීම මගින් ණය ගැනීම් අඩුකිරීමට විශේෂ අවධානයක් යොමු කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් හඳුන්වා දෙන මූල්‍ය සැලසුම්වලදී (Financial Programme) ඉහත කී කරුණුවලට විශේෂ අවධානයක් යොමු කෙරේ. විශාල අය-වැය පරතරයක් සහිත ආර්ථික අවදානම් සහිත ආර්ථික ලෙස සැළකෙන අතර ණය වර්ගීකරණ ආයතන ද මේ පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරයි.

## 2. විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම

ඉහත සාකච්ඡා කළ දේශීය වෙළෙඳපොළ තුළින් ණය ලබාගැනීමේ දී පැන නගින ගැටලු නිසා විකල්පයක් ලෙස රජයක් විදේශ මූලාශ්‍රවලින් ණය ගැනීමට යොමු වේ. එහෙත් එහි සාපේක්ෂ වාසි මෙන් ම අවාසි ද ඇත. සටහනෙහි දක්වා ඇති පරිදි විදේශ ණය ලබාගත හැකි මාර්ග ප්‍රධාන වශයෙන් ස්වභාවය සහ ප්‍රභවය අනුව කොටස් දෙකකට බෙදේ.

### 2.1 විදේශ ණය: ස්වභාවය අනුව

**2.1.1 සහනදායී ණය:** එක් එක් විදේශ ණය සඳහා වට්ටම් අනුපාතය සැළකිල්ලට ගත් කළ, සහනශීලීත්ව මිනුම[1] සියයට 35 ට වැඩි විදේශ ණය සහනදායී ණය ය. සාපේක්ෂ වශයෙන් වෙළෙඳපොළ පොලී අනුපාතවලට වඩා අඩු පොලියකට මෙම ණය ලැබේ. එයට හේතුව, මෙම ණය ලබා දෙන්නේ ආර්ථික හෝ දේශපාලනික වැනි අරමුණු සැළකිල්ලට ගනිමින් වීමයි. ණය දෙනු ලබන රට සමඟ ආර්ථික, වෙළෙඳ හෝ ආරක්ෂාව හෝ පිළිබඳ සම්බන්ධතා පවත්වා ගැනීම බොහෝවිට එමගින් අරමුණු කෙරේ. ජාත්‍යන්තර සංවිධාන විසින් එවැනි සහනදායී ණය දීමේ දී දිළිඳුකම දුරලීම, ආර්ථික සංවර්ධනය වැනි කරුණු සැළකිල්ලට ලක්කරනු ලැබේ. සහනදායී ණය සඳහා සාපේක්ෂ වශයෙන් දීර්ඝ සහන කාලයක් (Grace Period) (අවුරුදු 10 ක් පමණ) ලැබේ. එසේම ණය ආපසු ගෙවීමේ කාලය (Repayment Period) අවුරුදු 20-40 තරම් දීර්ඝ විය හැකි ය (ලංකාවට මෙලෙස ලැබී ඇති ඇතැම් ණය ගෙවා නිම කිරීමට ඇත්තේ 2051 දී ය). සහනදායී ණය සම්බන්ධ විශේෂත්වයක් වන්නේ එම ණය ලබාදීමේ දී නොයෙකුත් කොන්දේසි පැනවීමයි. උදාහරණ ලෙස, අදාළ ණය මුදල නිශ්චිත ව්‍යාපෘතියට පමණක් යෙදිය යුතු ය, ව්‍යාපෘතිය සඳහා විදේශවලින් ලබාගන්නා ප්‍රාග්ධන උපකරණ හෝ වෙනත් මිල දී ගැනීම් හෝ නම් කරන ලද රටකින් හෝ රටවල් කාණ්ඩයකින් මිල දී ගත යුතුය, යනාදී කොන්දේසි පැවතිය හැකිය.

**2.1.2 සහනදායී නොවන ණය :** කිසියම් විදේශ ණයක ඉහත සඳහන් කළ සහනශීලිත්ව අනුපාතය සියයට 35 ට අඩු නම් සහනදායී නොවන ණය ලෙස හඳුන්වයි. මෙම ණය සඳහා සහනදායී ණය පොලියට වඩා වැඩි පොලී අනුපාත ගෙවිය යුතු වේ. ඒ සඳහා ලැබෙන සහන කාලය ද අවුරුදු 3 - 5 තරම් අඩු කාලයක් වන අතර ණය ආපසු ගෙවන කාලය ද වසර 10 -20 තරම් සාපේක්ෂ වශයෙන් අඩු කාලයකි. මෙම ණය සඳහා ද යම් කිසි කොන්දේසි පැවතිය හැකි අතර බොහෝ දුරට අදාළ ව්‍යාපෘතියට පමණක් ණය දෙනු ලබයි.

බොහෝ විට සහනදායී හා සහනදායී නොවන ණය ලබා දෙන්නේ අඩු ආදායම් ලබන දිළිඳු රටවලටයි. ඒකපුද්ගල ජාතික ආදායම එක්සත් ජනපද ඩොලර් 1,000 ඉක්මවූ විට ක්‍රමයෙන් සහනදායී පදනම මත ණය දීම අඩු වේ. ශ්‍රී ලංකාව ද වර්තමානයේ මෙම තත්ත්වයට පත් වී ඇති අතර එවිට වාණිජ ණය ලබාගැනීමට සිදු වේ.

### 2.2 විදේශ ණය - ප්‍රභවය අනුව

**2.2.1 ද්විපාර්ශ්වික ණය:** ද්විපාර්ශ්වික ණය යනු රටවල් දෙකක් අතර ඇතිකර ගන්නා ගිවිසුම් අනුව ණය සැපයීමයි. මේවා ඉහත දැක්වූ සහනදායී ණය ගණයට අයත් වේ. යම් යම් ආර්ථික දේශපාලනික අරමුණු මුල් කරගත් හා කොන්දේසිවලට යටත්ව හෝ නොමැතිව මෙම ණය ලබාගත හැකිය. 2011 වර්ෂයේ ජපානය (සියයට 22.7), ජර්මනිය (සියයට 2.0) සහ චීනය (සියයට 2.5) යනා දී රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්විපාර්ශ්වික ණය ප්‍රදානය කරන රටවල් විය.

**2.2.2 බහුපාර්ශ්වික ණය:** රටවල් දෙකකට වැඩි සංඛ්‍යාවක් මැදිහත් ව සපයන ණය අරමුදල් බහුපාර්ශ්වික ණය ය. උදාහරණයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව (Asian Development Bank) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (International Development Society) 2011 දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන බහුපාර්ශ්වික ණය දෙන්නන් විය. මුළු ණය තොගය සඳහා එම සංවිධාන පිළිවෙලින් සියයට 16.5 සහ සියයට 13.0 ක් ලෙස දායක වී තිබිණි.

---

1. සහනශීලිත්ව මිනුම (Concessionality) - ණය මුදලේ මුහුණත අගය හා වට්ටම් කළ අනාගත ණය සේවාකරණ ගෙවීම් හි එකතුව අතර වෙනස ණය මුදලේ මුහුණත අගයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමකි. එය යම්කිසි ණය මුදලක සහනශීලිත්වයේ මිනුමක් ලෙස භාවිතා කරයි. - ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය 2010 - 59 පිටුව. ශ්‍රී ලංකා මහ බැංකුව

$$C = \frac{(FV - PV)}{FV} \times 100,$$

CF = මුදල් ප්‍රවාහය
r = පොලිය
FV = මුහුණත අගය
PV = වර්තන වටිනාකම

$$PV = \sum_{t=1}^{n} (CF)_{t} / 1+r)^{t}$$

**මූලාශ්‍රය** - Andrew Kitili, IMF, Debt Concessionality

**2.2.3 වාණිජ ණය (විදේශ):** වෙළෙඳපොළ පිළිගත් ණය උපකරණ (ණය සාධන පත්‍ර) භාවිතා කරමින් තරඟකාරී පොලී අනුපාත මත ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළින් ලබාගන්නා ණය මුදල් වාණිජ (විදේශ) ණය ලෙස සැලකේ. ජාත්‍යන්තර බැංකු, මූල්‍යායතන සහ ආයෝජකයන් සහභාගී වන වෙන්දේසි මගින් මෙම ණය ලබාගැනේ. මෙම වර්ගයේ ණය සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළේ තරගකාරී පොලී අනුපාත බලපවත්වන අතර ණය ලබා දෙන්නේ කොන්දේසි පැනවීමකින් තොරවය. ලබාගන්නා ණය තමන් කැමති කටයුත්තකට (සංවර්ධන ව්‍යාපෘති, අය-වැය හිඟය පියවීම, ලබාගත් ණය නැවත ගෙවීම, යුධ කටයුතු ආදී ඕනෑම කටයුත්තකට) යෙදිය හැකියි. මෙම ණය එකවර හෝ වාරික කිහිපයකින් හෝ ගෙවිය හැකිය. ශ්‍රී ලංකාව ද ප්‍රථම වරට 2007 දී ජාත්‍යන්තර වෙළෙඳපොළට අවුරුදු 5 කින් කල් පිරෙන ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 500 ක් ලබාගත් අතර අනතුරුව 2009 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 500 ක් ද ඉන් පසු 2010, 2011 සහ 2012 වර්ෂවලදී ඩොලර් මිලියන 1,000 බැගින් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම මගින් ණය ලබාගෙන ඇත.

**2.2.4 අපනයන ණය:** මෙම ණය සඳහා විදේශ රටවලින් ලැබෙන්නේ භාණ්ඩ ය. එම භාණ්ඩවල වටිනාකම ණය මුදලක් සේ සළකා (පොලිය රහිතව හෝ පොලිය සහිතව) පසුව ගෙවීමට අවසර දෙනු ලැබේ. ගෙවුම් ශේෂ ගැටලු පැනනැගී ඇති රටවලට මෙම ණය මගින් යම් සහනයක් ලැබෙන අතර ණය සපයනු ලබන රටෙහි අපනයන නිෂ්පාදකයාට ද මෙමගින් ගැනුම්කරුවකු ලැබේ. ඇතැම්විට ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රාග්ධන භාණ්ඩ, යන්ත්‍ර උපකරණ මෙවැනි ණය යටතේ ලැබෙයි. මුදල් ගෙවීම සඳහා ලැබෙන කාලපරාසය හා සහන කාලය සළකා මෙවැනි ගනුදෙනු ණයක් ලෙස ගැනේ.

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සංයුතිය**

ඉහත සාකච්ඡා කරනු ලැබුයේ රජයක් දේශීය හා විදේශීය වශයෙන් ණය ලබාගන්නා මූලාශ්‍ර පිළිබඳවයි. එසේ ලබාගත් ණය සකස් වී ඇති ආකාරය හෙවත් ව්‍යුහය රාජ්‍ය ණය සංයුතිය ලෙස දැක්වේ. එම සංයුතිය තුළ ඇත්තේ විවිධ උපකරණ තුළින් ලබාගත් ණය ප්‍රමාණයන් ය. මෙම උපකරණ ද මූලික වශයෙන් දේශීය මුදලින් ණය ලබාගැනීමේ උපකරණ හා විදේශීය මුදලින් ණය ලබාගැනීමේ උපකරණ ලෙස වර්ග කළ හැකිය. එසේ ම, දේශීය ණය උපකරණ හා විදේශීය ණය උපකරණවලින් ලබාගත් ණය ලෙස ද වර්ග කළ හැකි ය.

**දේශීය වෙළෙඳපොළ උපකරණ**

i. භාණ්ඩාගාර බිල්පත්
ii. භාණ්ඩාගාර බැඳුම්කර
iii. රුපියල් ණය
iv. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
v. මහ බැංකු අත්තිකාරම්
vi. වාණිජ බැංකු අයිරා
vii. අක්වෙරළ බැංකු ඒකක ණය

i. **භාණ්ඩාගාර බිල්පත්** යනු රජය කෙටිකාලීන ව (වසරකට අඩු කාලයක් සඳහා) ණය ලබාගන්නා උපකරණයකි. රජයට මුදල් අවශ්‍ය වූ විට වෙන්දේසියක් මගින් ප්‍රාථමික වෙළෙඳපොළට ඒවා නිකුත් කරනු ලැබේ. වර්තමානයේ දී මෙම වෙන්දේසියට ඉදිරිපත් විය හැක්කේ ඒ සඳහා පත්කරනු ලැබ සිටින ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ට සහ තෝරා ගත් ආයතනික ආයෝජකයන්ට පමණි. මෙම නියෝජිතයන් ප්‍රාථමික වෙන්දේසියෙන් ලබා ගන්නා භාණ්ඩාගාර බිල්පත් පසුව ද්විතීයික වෙළෙඳපොළේ දී විවිධ ආයෝජකයන්ට කිසියම් ලාභ ආන්තිකයකට යටත්ව අලෙවි කරනු ලබයි. මෙම උපකරණ අලෙවි කරනු ලබන්නේ එයට අදාළ පොලී අනුපාතිකය වට්ටමක් ලෙස ලබා දෙමින් ය. උදාහරණ ලෙස දින 364 කින් කල් පිරෙන සියයට 10 ක පොලී ප්‍රතිශතයක් ගෙවන බිල්පතක් මිලදී ගන්නා ආයෝජකයකු ඒ සඳහා ගෙවිය යුත්තේ බිල්පතෙහි මුහුණත වටිනාකමින් සියයට 90 කි. බිල්පත රුපියල් ලක්ෂයක වටිනාකමකින් යුක්ත වූයේ නම් එහි ගැනුම් මිල රු. 90,000/- කි. එම ආයෝජකයාට බිල්පත කල් පිරුණු විට රු. 100,000/- ක් ආපසු ලැබෙනු ඇත.

ii. **භාණ්ඩාගාර බැඳුම්කර** ද බිල්පත් මෙන් ම වෙන්දේසියක් මගින් වරින්වර ප්‍රාථමික වෙළෙපොළට නිකුත් කරන අතර වෙනසකට ඇත්තේ ඒවායේ කල් පිරෙන කාලය වසර 2 -20 දක්වා වීමත්, සෑම මාස 6 කට වරක්ම කිසියම් නිශ්චිත පොලී (කූපන්) අනුපාතයක් ආයෝජකයාට ගෙවීමත් ය. මේවා රජයේ මැදි හා දිගු කාලීන ණය ලබා ගැනීමේ උපකරණ ලෙස හඳුන්වන අතර මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ ණය උපකරණ ලෙස සැළකේ.

iii. **රුපියල් ණය** ද රජයට මැදි හා දිගු කාලීන ණය ලබාගන්නා තවත් උපකරණයකි. මේවායේ පොලී අනුපාතය තීරණය කරනු ලබන්නේ මහ බැංකුව විසින් ම වන අතර ටැප් ක්‍රමය (Tap System) යැයි කියනු ලබන අලෙවි කිරීම ආරම්භ කර අලෙවිය අවසන් වනතුරු මිලදී ගැනීමට විවෘත ව පවතී. පිටසන් කිරීමෙන් වෙනත් කෙනෙකුට පැවරිය හැකිය. පොලී ගෙවීම් හා කූපන් අනුපාත ගෙවීම භාණ්ඩාගාර බැඳුම්කරවලට සමාන ය. මෙම උපකරණ, මෑත කාලයේදී භාවිතා කර නොමැත.

iv. **ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර** යනු රජය දේශීය වෙළෙඳපොළින් විදේශ මුදලින් ණය ලබා ගැනීමේ උපකරණයකි. සාමාන්‍යයෙන් එක්සත් ජනපද ඩොලර්වලින් ලබාගන්නා මෙම ණය වෙන්දේසියක් තුළින් ලංසු කැඳවීමෙන් තරගකාරී පොලී අනුපාත මත ලබාගනී. පොලී අනුපාතයේ කොටසක් ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය (LIBOR) මත තීරණය වන අතර එයට එක් කළ ස්ථාවර ආන්තිකයක් ද වේ. උදාහරණ ලෙස 2012 ජුනි මස 18 දින නිකුත් කළ එ.ජ.ඩොලර් මිලියන 229 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල පොලී අනුපාතය වූයේ LIBOR + 4.10% කි. එදින ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය 0.78 ක් වූ බැවින් ගෙවිය යුතු පොලිය 0.780+4.10 = 4.88% කි. විදේශ මුදල් හිමි ආයෝජකයන්ට මෙම සංවර්ධන බැඳුම්කර මිල දී ගැනීම පිණිස පත්කළ බලයලත් නියෝජිතයන් මගින් ආයෝජනය කළ හැකි ය.

v. **මහ බැංකු අත්තිකාරම්:** ඉහත ක්‍රමවලට අමතරව රජයේ මූල්‍ය අවශ්‍යතා සඳහා රජයේ ආදායමින් සියයට 10 ක් දක්වා ප්‍රමාණයක් මහ බැංකුවෙන් අත්තිකාරමක් ලෙස රජයට ණය වශයෙන් පොලී රහිත ව ලබාගත හැකිය. එම මුදල මාස 6 ක් තුළ දී නැවත පියවිය යුතු බැවින් එය අත්තිකාරමක් ලෙස සැළකේ.

vi. **වාණිජ බැංකු අයිරා** පහසුකම යටතේ ණය ලබාගැනීම: ඉතා කෙටි කාලීන පදනමක් යටතේ රජයට වාණිජ බැංකුවලින් බැංකු අයිරා පහසුකම් ලබාගැනීමේ හැකියාව ද ඇත. වර්තමානයේ ශ්‍රී ලංකා රජය රාජ්‍ය බැංකුවලින් මෙම පහසුකම ලබාගන්නා අතර ඒ සඳහා ප්‍රතිමිලදී ගැනුම් පොලී අනුපාතයට එකතු කරනු ලබන පොලී ආන්තිකයක් පොලිය වශයෙන් ගෙවයි.

vii. **අක්වෙරළ බැංකු ඒකක ණය (Off-Shore Banking Unit)**: බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ මුදල්වලින් ගනුදෙනු කරනු ලබන ඒකක අක්වෙරළ බැංකු ඒකක ලෙස හඳුන්වයි. මෙම අක්වෙරළ ඒකකවලින් විදේශ මුදලින් ලබාගන්නා, ණය විදේශ ව්‍යවහාර මුදල් ණය ලෙස සැළකේ.

### ශ්‍රී ලංකාවේ මෑත කාලීන රාජ්‍ය ණය ප්‍රවණතා

**සංඛ්‍යා සටහන 1**


**රජයේ නොපියවූ ණය 2007 - 2011**

| අයිතමය | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| දේශීය ණය (රු.බිලියන) | 1,715.2 | 2,140.2 | 2,401.0 | 2,565.7 | 2,804.1 |
| විදේශීය ණය (රු.බිලියන) | 1,326.5 | 1,448.7 | 1,760.5 | 2,024.6 | 2,329.2 |
| මුළු ණය (රු.බිලියන) | 3,041.7 | 3,589.9 | 4,161.5 | 4,590.2 | 5,133.3 |
| මුළු ණය/ද.දේ.නි.හි ප්‍රති. | 85.0 | 81.4 | 86.2 | 81.9 | 78.5 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව**
**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

**1 රූප සටහන**


**දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතාංකයක් ලෙස ණය (2007 -2011)**




සංඛ්‍යා සටහන 1 අනුව 2007 අවසානයේ රජයේ සමස්ත දේශීය හා විදේශීය ණය රු. බිලියන 3,042 සිට 2011 අවසන් වන විට රු. බිලියන 5,133 දක්වා සියයට 69 කින් ඉහළ ගොස් ඇත. එය වාර්ෂිකව සියයට 14 කින් පමණ ඉහළ ගියත් ක්‍රමයෙන් අඩුවන වේගයකින් ඉහළ යාමක් පෙන්නුම් කරයි. එනම් 2008 දී සියයට 17.9 කින් ඉහළ ගිය අතර 2011 දී ඉහළ යාමේ වේගය සියයට 11.8 ක් දක්වා පහළ බැස තිබිණි. රටක ණය බර මනිනු ලබන එක් දර්ශකයක් වන්නේ මුළු ණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමය. ඒ අනුව, 2007 දී ණය බර දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 85.0 ක සිට 2011 වන විට සියයට 78.5 දක්වා අඩු වී ඇත. මෙ මගින් ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට සාපේක්ෂව රජයේ මුළු ණය ප්‍රමාණය අඩු වේගයකින් වර්ධනය වී ඇති බව පෙන්වයි. එනම් ණය ගෙවීමේ හැකියාව වර්ධනය වී ඇති බැව් පෙන්වයි. 1 රූපසටහනෙහි හි මුළු ණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෙන්වන රේඛාව 2007 වර්ෂයේ සිට 2011 දක්වා ක්‍රමයෙන් පහතට නැඹුරුවීමෙන් මේ බැව් නිරීක්ෂණය කළ හැකිය.

**2 රූප සටහන**

**ශ්‍රී ලංකාවේ ණය සංයුතිය**





රජයේ විදේශ ණය හා දේශීය ණය සංයුතිය 1 වන සංඛ්‍යා සටහනින් ද 2 රූපසටහනින් ද පෙන්නුම් කරයි. ඒ අනුව සැළකිය යුතු විදේශ ණය ප්‍රමාණයක් පැවැතීම විශේෂ ලක්ෂණයක් බව දැකිය හැකිය. මෑත වසරවල විශේෂයෙන් යුරෝපීය රටවල මූල්‍ය අර්බුද සමඟ ජාත්‍යන්තර වෙළෙඳපොළ පොලී අනුපාත සාපේක්ෂ වශයෙන් දේශීය පොලී අනුපාතයට වඩා පහත මට්ටමක පවතී. එබැවින් විදේශීය වෙළෙඳපොළින් ණය වැඩිපුර

ලබාගැනීමට රජය යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ ණය ඉහළ ගොස් ඇත. රජයේ සමස්ත ණය අවශ්‍යතාව දේශීය වෙළෙඳපොළෙින් ලබාගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් දේශීය වෙළෙඳපොළෙහි නො තිබීම ද විදේශ ණය ලබා ගැනීමට රජය යොමු වීමේ තවත් හේතුවකි. විදේශ ණය අතරින් තවමත් සහනදායී ණය ප්‍රමාණය සියයට 57 ක් වන අතර සහනදායී නොවන ණය සියයට 43 ක් බව 3 රූප සටහනින් පැහැදිලි වේ.

රජයේ නොපියවූ දේශීය ණය සංයුතිය 4 වන රූප සටහනින්


**3 රූප සටහන**

**ශ්‍රී ලංකාවේ විදේශ ණය සංයුතිය - 2011**




**4 රූප සටහන**

**2011 වසර අවසානයේ ශ්‍රී ලංකා රජයේ නොපියවූ (ස්වභාවය අනුව) දේශීය ණය සංයුතිය**




දැක්වේ. එහි දැක්වෙන පරිදි දේශීය වශයෙන් ගෙවීමට ඇති ණය තොගයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් අයත්වනුයේ මැදි හා දිගු කාලීන ගණයට අයත්වන භාණ්ඩාගාර බැඳුම්කර, සංවර්ධන බැඳුම්කර හා රුපියල් ණය වලටය. ඒ අනුව ණය ගෙවීමේ අවදානම දීර්ඝ කාලයකට ව්‍යාප්ත වී ඇත. එ මෙන් ම ණය ලබා ගැනීමේ දී ඒ ඒ ණය උපකරණවල වැදගත්කම ද ඒ ඒ උපකරණ අතර අවදානම බෙදී ගොස් ඇති ආකාරය ද මෙම රූප සටහනින් පිළිබිඹු වේ.

**රාජ්‍ය ණය ඉහළ යෑමට හේතු**

රටක රාජ්‍ය ණය ඉහළ යෑමට හේතු විය හැකි කරුණු කීපයකි.

i. සමස්ත අය-වැය හිඟය අඛණ්ඩව ඉහළ යෑම - මෙයට බලපාන හේතු දෙකකි; ඒවා නම් ප්‍රාථමික ගිණුමේ හිඟයක් පැවතීම සහ පොලී ගෙවීම ඉහළ මට්ටමක පැවතීම ය. ආදායම ඉක්මවා වියදම් කරන විට ප්‍රාථමික ගිණුමේ හිඟයක් ඇති වේ. ආදායම වියදමට වඩා වැඩි නම් ප්‍රාථමික ගිණුමේ ධන ශේෂයක් පැවතියත් අධික ලෙස පොලී ගෙවීමට සිදුවුව හොත් සමස්ත ශේෂය සෘණ ශේෂයක් විය හැකිය.

ii. ණය උපකරණ වට්ටමක් යටතේ නිකුත් කිරීම - ණය උපකරණ නිකුත් කිරීමේ දී වට්ටමකට යටත්ව නිකුත් කරන බැවින් ඒවායේ පොලිය අධික නම් මුදල් වශයෙන් රජයට ලැබෙන ප්‍රමාණය සහ ණය උපකරණවල (සාධන පත්‍ර) මුහුණත වටිනාකම අතර වෙනස විශාල වේ. ඒ නිසා වැඩි මුදලක් ලබාගැනීමට නිකුත් කරන ණය මුදල ද ඉහළ දැමිය යුතු වේ. ඒ නිසා ණය තොගය ඉහළ යයි.

iii. දේශීය මුදල විශාල ලෙස අවප්‍රමාණය වුවහොත් ගෙවිය යුතු විදේශ ණය මුදල්වල රුපියල් වටිනාකම විශාල වෙයි. උදා: එ.ජ.ඩොලරයක් රු. 100/- ක් ව තිබිය දී ඩොලර් 1,000 ක ණයක් ගතහොත් පොලිය හැර මුල් මුදල ලෙස ආපසු ගෙවිය යුතු වන්නේ රු. 100,000/- කි. යම් හෙයකින් රුපියල අවප්‍රමාණ වී ඩොලර් 1 = රු.125 වුවහොත් ගෙවිය යුතු මුදල ද රු. 1000 x 125 = 125,000/- කි. එනිසා, විනිමය අනුපාතිකය ඉහළ ගියහොත් ගෙවිය යුතු මුදල ද විශාල වේ.

**රාජ්‍ය ණය ඉහළ යෑමේ ප්‍රතිවිපාක**

රාජ්‍ය ණය ලබාගැනීමේ විවිධ මාර්ග ඇති බවත් ඒ එක් එක් උපාය මාර්ගය හා බැඳුනු ප්‍රතිවිපාකත් ආරම්භයේ දී ද සාකච්ඡා කළෙමු. ණය පියවීමේ දී බොහෝ විට සිදුකරනුයේ නැවත ණය ගැනීමයි. ඒ සඳහා දේශීය ප්‍රසාරණාත්මක මාර්ග යොදාගත හොත් (මහ බැංකු අත්තිකාරම්, මහ බැංකුවෙන් ණය ගැනීම්, වාණිජ බැංකුවලින් ණය ගැනීම්) එය උද්ධමනයට හේතු වන බව එහි දී කීවෙමු. අනෙක් අතට වාණිජ බැංකුවලින් ණය ලබාගැනීම නිසා පෞද්ගලික අංශයට ගලා යන මුදල් ප්‍රමාණය සීමා වී තෙරපීමේ ප්‍රතිවිපාක ඇති වෙයි. පෞද්ගලික අංශයට මුදල් ගලායෑම අඩු වීම රට තුළ ආයෝජන අඩු වී ජාතික ආදායම් වර්ධනය ද අඩුවීම කෙරෙහි බලපායි. එය රැකියා උත්පාදනය කෙරෙහි ද එතුළින් රැකියා වියුක්තියට ද හේතු විය හැකිය. රජය අධික ලෙස දේශීය වශයෙන් වෙළෙඳපොළින් ණය ගැනීම නිසා වෙළෙඳපොළ අරමුදල් සඳහා ඉල්ලුම ඉහළ ගොස් පොලී අනුපාතය ඉහළ යයි. එහි අවසන් ප්‍රතිඵලය වනුයේ ජාතික නිෂ්පාදිතයට අහිතකර බලපෑමක් සිදුවීමයි. එහෙත් රජය විසින් ලබාගන්නා ණය මුදල් නැවත රට තුළ නිසි පරිදි ආයෝජනය කෙරේ නම් (සංවර්ධන ව්‍යාපෘති හෝ යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා) එ මගින් දිගු කාලීන ව රැකියා උත්පාදනයත් ඵලදායීතාවත් ඉහළ යෑමෙන් පෞද්ගලික අංශයේ ආයෝජන ඌනතාවයට පිළියමක් වනු ඇතැයි ද තර්කයක් මතුවේ. එහි දී රාජ්‍ය හා පෞද්ගලික අංශ යන දෙකෙහි ප්‍රාග්ධනයේ ආන්තික කාර්යක්ෂමතාව

අනුව වඩාත් ඵලදායී මාර්ගය තෝරා ගැනීමට සිදු වේ. රාජ්‍ය ණයවලින් සැළකිය යුතු ප්‍රමාණයක් කෙටිකාලීන ණයවලින් සමන්විත වුවහොත් ණය ගෙවීමේ ගැටලුවක් නැතහොත් අවදානමක් පැන නගී.

ණය බර අධික වීමෙන් අවදානම ඉහළ යෑම නිසා දේශීය මෙන්ම විදේශ ආයෝජකයන් ද එම රටෙහි ආයෝජනයට (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි) මැලි වීම නිසා රජයට ණය ලබාගැනීමේ හැකියාව අඩු වේ. අවදානම ඉහළ යෑම නිසා ඉහළ පොලියක් ගෙවීමට සිදු වේ.

**රාජ්‍ය ණය බර අධික වීමට පිළියම්**

රාජ්‍ය ණය අධික වීමට මූලික හේතුව රජයේ වියදම් ඉහළ යෑම බැවින් සම්ප්‍රදායික හා ඍජු විසඳුම විය යුත්තේ රජයේ වියදම් සීමා කිරීම විය යුතුය. ඒ පිළිබඳ මූලික වගකීම පැවරෙනුයේ රජයට - පාර්ලිමේන්තුවට බැවින් ණය කළමනාකරුවන්ට ඒ පිළිබඳව බලපෑමක් කළ නොහැකි වේ. රාජ්‍ය මූල්‍ය සැලැස්ම හෝ මූල්‍ය විනය පිළිබඳව යම් යම් මග පෙන්වීම් සඳහා ලැබෙන ඉඩ ප්‍රස්ථා ප්‍රයෝජනයට ගැනීම මෙහි ලා වැදගත් ය.

ණය කළමනාකරුවන් ගේ පාර්ශ්වයෙන් කළ හැකි කාර්යයන් හා වගකීම් දෙකක් පවතී. එනම් පිරිවැය අවම වන ආකාරයට අඩු පොලියට ණය ගැනීම සඳහා ණය සැලසුම් කිරීම, වෙළෙඳපොළ වර්ධනය කිරීම, කාර්යක්ෂම උපකරණ හා උපක්‍රම යොදා ගැනීම තුළින් පිරිවැය අවම කිරීමට ඉඩ සැලසේ. උදාහරණයක් ලෙස දේශීය වෙළෙඳපොළට වඩා අඩු පොලියට විදේශ වෙළෙඳපොළින් ණය ලබාගත හැකි විට එසේ කිරීම, පොලී අනුපාත ඉහළ යන විට කෙටි කාලීන ණය ලබාගැනීම, ණය කල් පිරීම හා ණය නිකුත් කිරීම අතර මනා ගැලපීමක් ඇති කර ගැනීම (ද්‍රවශීලතා ගැටලු මඟහැරීම) වැනි උපක්‍රම සුදුසු පරිදි භාවිතා කිරීමේ අවස්ථාව ණය කළමනාකරුවන් සතු වේ.

අවදානම අඩු වන ආකාරයට ණය ගැනීම ද ණය බර අවම කර ගැනීමේ එක් උපක්‍රමයකි. විදේශ ණය හා දේශීය ණය අතර මනා ගැලපීමක් තබාගැනීම-විනිමය අනුපාත ප්‍රවණතා සැළකිල්ලට ගෙන විදේශ ණය ගැනිම-එහි දී එක් උපක්‍රමයකි. විනිමය අනුපාත ඉහළ යෑමේ ප්‍රවණතාවක් තිබිය දී විදේශ ණය ගැනීම් වැඩි කළහොත් එ මගින් අනාගත ණය බර නිසැකව ම ඉහළ යනු ඇත. අනාගතයේ දී ණය ගෙවීමේ හැකියාව පිළිබඳ නිවැරදි තක්සේරුවක් යටතේ ණය ගැනීමෙන් අවදානම අඩු කළ හැකි ය. අනාගත ආදායම්, ආර්ථික වර්ධනයන්, ව්‍යාපෘතිවල ඵලදාව ලැබීම යනාදිය සැළකිල්ලට ලක්කර ණය ගැනීමෙන් අනාගත අවදානම අඩු කළ හැකි අතර එ මගින් ණය බර ද අඩු වේ.✪

(...12 පිටුවෙන්)

වෙළෙඳපොළ මට්ටමේ තොරතුරු අසමමිතිකතා විසඳීම සඳහා නොයෙක් නීති සම්පාදනය මෙන්ම දණ්ඩන ප්‍රයෝග ද භාවිතා වේ.

අලෙවි කරන භාණ්ඩවල අන්තර්ගතය භාණ්ඩයේ දවටනයේ සඳහන් කළ යුතු ය යන නීතිය, සඳහන් කළ ගුණාත්මක බව නොමැති නම් ඒ සඳහා වන්දි ලබා ගැනීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන ඇති කිරීම හා විවිධ ප්‍රමිතීන් හඳුන්වා දීම වැනි දේ රජය අරඹන්නේ තොරතුරු අසමමිතිකතා ගැටලුවට සපයන නීතිමය විසඳුම් ලෙසයි.

ප්‍රායෝගික සමාජයීය පරිසරය දෙස බලනවිට පෙනී යන්නේ මානව වර්ගයා තොරතුරුවල අසමමිතිකතාව හා අපූර්ණත්වය නිසා ගන්නා වූ තීන්දු තීරණ ප්‍රශස්ථ අවස්ථාවට පැමිණි තීරණ නොවන බවයි. එනිසා තොරතුරුවල පූර්ණත්වයක් මත සිට තීරණ ගැනීම වඩාත් පලදායි වනු ඇති බව මෙමඟින් පැහැදිලි වනු ඇත.

ශ්‍රී ලාංකීය සමාජය දෙස බැලීමේ දී මෙම ගැටලුව සඳහා විසඳුමක් වශයෙන් ලංකාව තුළ පවත්නා සියලුම පුද්ගල හා ආයතනික තොරතුරු ඒකරාශි කර කුඩා ප්‍රමාණයේ නාමාවලියක් සකස් කර සියලුම ජනතාව වෙත ලබාදීම තුළින් තොරතුරුවල දෘශ්‍ය පූර්ණත්වය ඇති කළ හැකිය. ඒ තුළින් අවම කාලයකින් ප්‍රශස්ථ තීරණය ගැනීම සඳහා උපකාරී විය හැකි බව වැඩිදුරටත් පෙන්වා දිය හැකි ය.✪

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. Akerlof,George A (1970) The Market for Lemons Quality Uncertainty and the Market Mechanism. Quarterly Journal of Economics.
2. Kenneth J Arrow (1999) Information and the Organization of Industry. Cambridge University Press, pp 20-21.
3. Brown, Stephen ; Hillegeist , Stephen Lo.kin ( 2004) Conference Calls and Information Asymmetry. Journal of Accounting and Economics.
4. Birchler URS and Monika Butler (2007) Information Economics London, Routledge.
5. Nelson , Phillip (1970) Information and Consumer Behavior. Journal of Political Economy.
6. Michael Spence (2002) Signaling in Retrospect and the Informational Structure of Markets. American Economic Review.

# ශ්‍රී ලංකා මහ බැංකුවේ නවතම ප්‍රකාශන





රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.